# HARTI

# ආහාර තොරතුරු විවරණිකාව

13 වෙළුම | 2020 අප්‍රේල්- මැයි | නො.:04/05

## සහල්

මාර්තු මාසයට සාපේක්ෂව මැයි මාසයේදී සියළුම සහල් වර්ගවල තොග මිල ගණන් 1%-6% පරාසය තුළ ඉහළ ගොස් තිබුණි. සහල් කිලෝවක තොග මිල රු.88.00ත් රු.98.00ත් පරාසය තුළ පැවතුණි. මැයි මාසයේදී සාමාන්‍යයෙන් සහල් මිල ගණන් ඉහළ යාමක් දක්නට ලැබේ. කොවිඩ් -19 වසංගතය හේතුවෙන් සහල් ඉල්ලුම ඉහළයාමත් සහල් බෙදාහැරීමේ කටයුතුවලට බාධා එල්ලවීමත්, සහල් මිල ඉහළයාම සඳහා අමතර හේතුවක් විය. සහල් මිල ඉහළයාම පාලනය කිරීම සඳහා රජය විසින් සහල් නිෂ්පාදන කටයුතු අත්‍යවශ්‍ය සේවාවක් බවට ප්‍රකාශ කිරීමත් සහල් සඳහා උපරිම මිල සංශෝධනය කිරීමත් සිදුකරන ලදී.




## එළවළු

මහ කන්නයේ අස්වනු නෙලීමේ කටයුතු අප්‍රේල් සහ මැයි මාසවලදී ද සිදු වූ බැවින් රට තුළ ප්‍රමාණවත් තරම් එළවළු නිෂ්පාදන පැවතුණි. එමෙන්ම කොවිඩ්-19 වසංගතය හේතුවෙන් අඩාල වූ බෙදාහැරීමේ කටයුතු යථාවත් කිරීම සඳහා රජය විසින් විවිධ ප්‍රතිපත්තිමය තීරණ ගන්නා ලදී. එබැවින් මාර්තු මාසයට සාපේක්ෂව මැයි මාසයේදී එළවළු තොග මිල ගණන් 5%-53% පරාසය තුළ පහළ ගියේ ය. එළවළු කිලෝවක් සඳහා උපරිම තොග මිල රු.180.00ක් ලෙස බෝංචි සඳහා ද අවම මිල රු.20.00ක් ලෙස බීට්රූට්, නෝකෝල්, ගෝවා සහ පිපිඤ්ඤා සඳහා ද වාර්තා විය.




අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය ,
හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය
114, විජේරාම මාවත , කොළඹ 07.
කෘෂිකර්ම අමාත්‍යාංශය
දු.අ. 011-2696981
ෆැක්ස් 011-2682283
විද්‍යුත් තැපැල mfpaharti@yahoo.com.
අන්තර් ජාලය www.harti.gov.lk

**සටහන**

මෙම විවරණිකාව මාසිකව ප්‍රකාශයට පත් කරනු ලබන අතර ඒ මගින් තෝරා ගන්නා ලද ප්‍රධාන ආහාර ද්‍රව්‍යයන්ගේ ගොවිපල මිල, තොග මිල සහ සිල්ලර මිල පිළිබඳව සලකා බැලේ. මෙහිදී ඉදිරිපත් කරන තොරතුරු කොළඹ සහ තදාසන්න නාගරික කේන්ද්‍ර කීපයක සහ තෝරා ගන්නා ලද ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවල වෙළෙඳපොළ ආශ්‍රයෙන් සිදු කෙරේ. වගා බිම් ප්‍රමාණය, නිෂ්පාදන ප්‍රමාණය සහ ආනයන ප්‍රමාණය යන තොරතුරු මෙම විවරණිකාවේ අන්තර්ගත වේ.

පවතින මිල ගණන්, මිල පරාසයන් සාමාන්‍ය, පසුගිය මාසයේ සහ පසුගිය වර්ෂයේ එම මිල ගණන් සමඟ සංසන්දනාත්මකව විග්‍රහ කෙරේ. මෙහි තිබෙන මිල ගණන් විශේෂයෙන් සඳහන් නොකර තිබේ නම් එය පසුගිය මාසයේ මිල ගණන් හා සංසන්දනය කර ඇති බව සැලකේ. කොරෝනා වෛරසය පැතිර යාම හේතුවෙන් ආහාර තොරතුරු විවරණිකාවේ මාර්තු මාසයට අදාළ දත්ත සහ තොරතුරු එක්රැස් කිරීමේ ක්‍රියාවලියට බාධා එල්ල විය. එම නිසා මෙම කලාපය තුළ අප්‍රේල් මාසයට අදාළ මිල තොරතුරු අන්තර්ගත නොවන අතර මැයි මාසය සඳහා තොග මිල ගණන් පමණක් අන්තර්ගත වේ. තවද මැයි මාසය සඳහා මිල තොරුතුරු අවසන් සති තුන සඳහා පමණි. මිල තොරුතුරු සංසන්දනය කිරීම මාර්තු මාසයට සාපේක්ෂව සිදු කර ඇත.


**සම්බන්ධීකරණය**

ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර

**පර්යේෂණ කණ්ඩායම**

| | |
|---|---|
| ඩබ්.ඒ.එන්.විජේසූරිය | - වී |
| ආචාර්ය එන්.පී.ජී.සමන්ත | - සහල් |
| රෝෂිණී රඹුක්වැල්ල | - වියළි මිරිස්, ළූණු |
| ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර | - එළවළු |
| රුචිනි විදානපතිරණ | - අර්තාපල් |
| ඉන්දිකා එදිරිසිංහ | - පලතුරු |
| ආචාර්ය ඊ.ඒ.සී.ප්‍රියංකර | - කරවල, මස්, මාළු, බිත්තර |
| අයි.වී.කුරුප්පු | - තිරිඟු පිටි , සීනි |
| අයි.පී.පී.එම්.විජේසිංහ | - මාෂ භෝග |

**දත්ත සහ තොරතුරු සම්පාදනය**

ආර්.එම්.බී.කේ.සෙනවිරත්න — ඩබ්.ජී.එන්.මල්කාන්ති

කේ.කේ.මයුමි අප්සරා — ඩී.එම්.ඩී.එස්. ප්‍රේමදාස

**දත්ත සැකසුම**

කේ.ඒ.ආර්.පත්මසිරි

**පරිගණක ගත කිරීම**

චන්ද්‍රිකා හෙට්ටිගේ


දත්ත රැස් කරන ප්‍රදේශ

**කොළඹ සහ අවට වෙළෙඳපොළවල්**

1. පිටකොටුව
2. නාරාහේන්පිට
3. දෙමටගොඩ
4. තොටලඟ
5. පෑලියගොඩ
6. කඩවත
7. කිරිබත්ගොඩ
8. වැල්ලවත්ත
9. කිරුළපන
10. නුගේගොඩ

**පිට පළාත් වෙළෙඳපොළවල්**

1. නුවරඑළිය
2. දඹුල්ල
3. මාතර
4. කුරුණෑගල
5. ඇඹිලිපිටිය
6. නුවර
7. මීගොඩ
8. කළුතර
9. දිවුලපිටිය
10. හම්බන්තොට
11. කැප්පෙටිපොළ
12. පුත්තලම
13. තඹුත්තේගම
14. අනුරාධපුරය
15. රත්නපුර
16. දෙහිඅත්තකණ්ඩිය
17. බදුල්ල
18. තිස්සමහාරාමය
19. නිකවැරටිය
20. පොලොන්නරුව
21. ගාල්ල
22. මන්නාරම
23. මඩකලපුව
24. ත්‍රිකුණාමලය
25. යාපනය
26. මුලතිව්
27. වව්නියාව
28. කිලිනොච්චිය
29. කෑගල්ල
30. අම්පාර
31. මොණරාගල

# 01. වී නිෂ්පාදනය

## භෝග තත්ත්වය

කොවිඩ් 19 වසංගත තත්ත්වය ව්‍යාප්ත වීම හේතුවෙන් රට පුරා සංචාරක සීමාවන් පනවා තිබුණු පසුබිමක රජය විසින් ගොවීන් කෘෂිකාර්මික කටයුතු සඳහා විශේෂයෙන් වී වගා කටයුතු කෙරෙහි යොමු වීම ධෛර්යමත් කිරීම සඳහා අවශ්‍ය කඩිනම් ක්‍රියාමාර්ග සිදුකරන ලදී. එමෙන්ම යහපත් කාලගුණික තත්ත්වයක් පැවතීම සහ කන්නය ආරම්භයේදී සතුටුදායක ලෙස වාරි ජල සම්පාදනයක් පැවතීම හේතුවෙන් කන්නය අපේක්ෂා කළ පරිදිම වී වගා කටයුතු සතුටුදායක මට්ටමක පැවතුණි. සියලුම ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශවල 2020 යල කන්නයට අදාළ වගා ස්ථාපිත කිරීම සම්පූර්ණ කර පැවතුණි. කෙසේ වුවද, බෙදාහැරීමේ ගැටලු පැවතීම හේතුවෙන්, ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශ කිහිපයක පෙහොර සම්බන්ධ ගැටලු පවතින බවට වාර්තා විය. කෘෂිකර්ම දෙපර්තමේන්තුව විසින් නිකුත් කරන ලද නවතම ඇගයීම් වාර්තාවට අනුව, යල කන්නය සඳහා අපේක්ෂිත වී වගා භූමි ප්‍රමාණය හෙක්ටයාර 475,254කි. මැයි මාසය අවසන් වන විට වගා කර ඇති භූමි ප්‍රමාණය හෙක්ටයාර 429,600ක් වන අතර එය අපේක්ෂිත ඉලක්කයෙන් 90%කි. පසුගිය යල කන්න තුනෙහි වගා කළ භූමි ප්‍රමාණයේ සාමාන්‍ය අගයට වඩා 29%ක ඉහළ වගා භූමි ප්‍රතිශතයක් මෙම කන්නයේ දක්නට ලැබුණි. මැයි මාසය අවසන් වන විට වාර්තා වන වී වගා භූමි ප්‍රමාණයට අනුව මෙම යල කන්නයේ අපේක්ෂිත වී නිෂ්පාදනය මෙ.ටො.මි. 1.72කි. (එය 68%ක වී කෙටීමේ ප්‍රතිශතයකට අනුව මෙ.ටො.මිලියන. 1.025කි). ජුනි මාසය මැද කාල සීමාව වනතුරු තවදුරටත් වී වගා කටයුතු සුළු වශයෙන් සිදුකෙරෙනු ඇතැයි අපේක්ෂා කෙරේ.

**වගුව 1.1 : 2020 යල කන්නයේ වී වගාවේ ප්‍රගතිය**
**(මැයි මාසය අවසානය දක්වා )**

| දිස්ත්‍රික්කය/ ප්‍රදේශය | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | වගා ප්‍රගතිය (හෙක්.) | ප්‍රගතිය (%) | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) | ගංවතුර හේතුවෙන් හානි වූ බිම් ප්‍රමාණය (හෙක්.) | අපේක්ෂිත අහිමිවන අස්වනු ප්‍රමාණය (මෙ.ටො.) | සංශෝධිත අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|---|
| අනුරාධපුරය | 39,678 | 19,612 | 49 | 74,887 | - | - | 74,887 |
| පොලොන්නරුව | 31,911 | 30,057 | 94 | 136,929 | - | - | 136,929 |
| අම්පාර | 57,983 | 54,918 | 95 | 253,072 | 275 | 334 | 252,738 |
| කුරුණෑගල | 65,106 | 54,372 | 84 | 217,147 | - | - | 217,147 |
| හම්බන්තොට | 27,284 | 23,056 | 85 | 116,021 | 122 | 154 | 115,867 |
| කොළඹ | 1,957 | 3,127 | 160 | 8,000 | - | - | 8,000 |
| ගම්පහ | 6,587 | 10,585 | 161 | 27,352 | - | - | 27,352 |
| කළුතර | 6,799 | 11,259 | 166 | 31,574 | - | - | 31,574 |
| ගාල්ල | 10,864 | 8,926 | 82 | 20,187 | - | - | 20,187 |
| මාතර | 14,818 | 12,735 | 86 | 35,492 | - | - | 35,492 |
| රත්නපුරය | 8,403 | 5,825 | 69 | 20,053 | - | - | 20,053 |
| කෑගල්ල | 7,380 | 6,928 | 94 | 19,211 | - | - | 19,211 |
| පුත්තලම | 17,864 | 14,492 | 81 | 53,704 | - | - | 53,704 |
| මහනුවර | 8,532 | 7,070 | 83 | 21,689 | - | - | 21,689 |
| මාතලේ | 12,484 | 7,386 | 59 | 31,227 | - | - | 31,227 |
| නුවරඑළිය | 2,687 | 237 | 9 | 463 | - | - | 463 |
| බදුල්ල | 7,603 | 5,850 | 77 | 23,719 | - | - | 23,719 |
| මොණරාගල | 17,148 | 11,990 | 70 | 52,172 | - | - | 52,172 |
| යාපනය | - | - | - | - | - | - | - |
| කිලිනොච්චි | 8,781 | 8,688 | 99 | 35,955 | - | - | 35,955 |
| වව්නියාව | 4,000 | 2,541 | 64 | 10,991 | - | - | 10,991 |
| මුලතිව් | 5,634 | 6,077 | 108 | 23,777 | - | - | 23,777 |
| මන්නාරම | 2,000 | 1,103 | 55 | 4,609 | - | - | 4,609 |
| ත්‍රිකුණාමලය | 24,256 | 20,109 | 83 | 92,254 | - | - | 92,254 |
| මඩකලපුව | 33,233 | 33,233 | 100 | 109,680 | - | - | 109,680 |
| උඩවලව | 5,000 | 10,260 | 205 | 53,765 | - | - | 53,765 |
| මහවැලි එච් | 1,270 | 10,686 | 841 | 44,672 | - | - | 44,672 |
| මහවැලි එච් 1 | Na | 1,408 | - | 5,886 | - | - | 5,886 |
| මහවැලි බී | 19,733 | 19,840 | 101 | 82,939 | - | - | 82,939 |
| මහවැලි සී | 20,172 | 21,955 | 109 | 91,781 | - | - | 91,781 |
| මහවැලි ජී | 4,357 | 3,559 | 82 | 14,878 | - | - | 14,878 |
| මහවැලි ඩී | 750 | 750 | 100 | 3,135 | - | - | 3,135 |
| රඹකැන්ඔය | 238 | 225 | 95 | 941 | - | - | 941 |
| මහවැලි එල් | 742 | 742 | 100 | 3,102 | - | - | 3,102 |
| **ශ්‍රී ලංකාව** | **475254** | **429600** | **90** | **1721263** | **397** | **488** | **1720774** |

*මූලාශ්‍රය : භෝග පුරෝකථන වාර්තාව **2020 -01,** සමාජ ආර්ථික සැලසුම් ඒකකය ,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

## වී ගොවියාට ලැබුණු මිල

සියලුම ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශවලින් වෙළෙඳපොළ වෙත සීමිත වී සැපයුමක් ලැබීම හේතුවෙන් වී මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවයක් මාසය පුරාවටම දක්නට ලැබුණි. රටෙහි උද්ගතව පැවති වසංගත තත්ත්වය හේතුවෙන් වෙළඳපොළෙහි ඇති වී තිබූ අවිනිශ්චිත වාතාවරණය මත වෙළෙඳපොළ වෙත වී නිකුත් කිරීම සීමාසහිත කිරීමට වී ගොවීන් සහ වෙළෙන්දන් විසින් පියවර ගෙන තිබීම මෙයට හේතු විය. එම නිසා සියලුම ප්‍රධාන වී නිෂ්පාදන ප්‍රදේශවල මාර්තු මාසය සමඟ සසඳන විට සුදු දිග වී මාසික සාමාන්‍ය මිල 8%-24% දක්වා පරාසයක ඉහළ ගොස් ඇති අතර උපරිම මිල ඉහළයාම කලාවැව ප්‍රදේශයෙන් වාර්තා විය. මේ අතර කෙටි වී මිල ද 7%-21% දක්වා පරාසයක ඉහළ ගොස් ඇති අතර උපරිම මිල ඉහළයාම කලාවැව ප්‍රදේශයෙන් ම වාර්තා විය. කෙටි වී සහ දිග සුදු වී දෙවර්ගය සඳහාම මිල පරාසයන් කිලෝවකට රු. 44.00-55.00 දක්වා අතර පරාසයක පැවතුණි. දිග රතු වී සඳහා ද මාසික සාමාන්‍ය මිල මාතර ප්‍රදේශයේ 7%කින් ද ඇඹිලිපිටිය ප්‍රදේශයේ 10%කින් ද ඉහළ ගොස් ඇති අතර මිල ගණන් කිලෝවකට රු.48.00-53.00 දක්වා පරාසයක සටහන් විය. ක්ෂේත්‍ර තොරතුරු වලට අනුව සීමිත වී සැපයුමක් පැවතීම හේතුවෙන් ඉදිරි මාසයේදී වී මිල ගණන් තවදුරටත් ඉහළයාමේ ප්‍රවණතාවයක් පවතිනු ඇතැයි අපේක්ෂා කෙරේ.

පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සලකාබලන සියලු වී නිෂ්පාදන ප්‍රදේශවල සියලුම වී වර්ගයන්හි මිල ගණන් ඉහළ යාමේ ප්‍රවණතාවයක් පැවතුණි. කෙටි වී මිල 17%-33% දක්වා පරාසයක ඉහළ ගොස් ඇති අතර උපරිම මිල ඉහළයාම කලාවැව ප්‍රදේශයෙන් වාර්තා විය. එමෙන්ම දිග සුදු වී මිල 14%-23% දක්වා පරාසයක ඉහළයාමක් සියලු සලකා බැලෙන නිෂ්පාදන ප්‍රදේශවලින් වාර්තා විය. එමෙන්ම, රතු දිග වී මිල හම්බන්තොට ප්‍රදේශයේ 38%ක් සහ ඇඹිලිපිටිය ප්‍රදේශයේ 45%ක් ලෙස ඉහළ ගොස් තිබුණි.

### වගුව1.2 : වී සඳහා ගොවියාට ලැබුණු මිල - 2020 මැයි

| වර්ගය/ ප්‍රදේශය | මිල පරාසය | | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මාර්තු | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | % | කි.ග්‍රෑ.රු | % |
| **කෙටි වී (සම්බා)** | | | | | | | | | |
| අනුරාධපුරය | - | 42.00-50.00 | - | 45.98 | 39.44 | - | - | - | - |
| පොලොන්නරුව | 53.90-55.00 | 42.96-53.13 | 54.47 | 47.33 | 41.95 | *7.14* | *15.09* | *12.52* | *29.85* |
| කලාවැව | 52.00-55.00 | 42.00-47.00 | 53.33 | 44.25 | 40.00 | *9.08* | *20.53* | *13.33* | *33.33* |
| කුරුණෑගල | 44.00-55.00 | 44.00-50.00 | 50.34 | 46.83 | 43.08 | *3.51* | *7.50* | *7.26* | *16.85* |
| දෙහිඅත්තකණ්ඩිය | 50.00-54.68 | 44.00-50.78 | 51.36 | 47.01 | *39.75* | *4.36* | *9.26* | *11.61* | *29.21* |
| නිකවැරටිය | 49.50-54.50 | 44.00-50.00 | 51.33 | 45.37 | - | *5.96* | *13.15* | - | - |
| අම්පාර | | 49.00-50.00 | - | 49.40 | 39.43 | - | - | - | - |
| **සුදු දිග වී (නාඩු)** | | | | | | | | | |
| අනුරාධපුරය | | 39.00-48.00 | - | 44.15 | 41.71 | - | - | - | - |
| පොලොන්නරුව | 53.13-55.00 | 41.40-49.60 | 54.00 | 45.05 | 43.92 | *8.95* | *19.87* | *10.08* | *22.94* |
| කලාවැව | 50.00-54.00 | 39.50-45.00 | 51.55 | 41.67 | 42.50 | *9.88* | *23.72* | *9.05* | *21.29* |
| කුරුණෑගල | 44.00-55.00 | 44.00-50.00 | 50.41 | 46.83 | 44.21 | *3.58* | *7.64* | *6.20* | *14.03* |
| දෙහිඅත්තකණ්ඩිය | 49.00-54.68 | 40.00-50.00 | 51.25 | 44.87 | 41.13 | *6.38* | *14.22* | *10.13* | *24.62* |
| ඇඹිලිපිටිය | | | - | - | - | - | - | - | - |
| නිකවැරටිය | 48.50-54.00 | 42.00-50.00 | 50.38 | 44.36 | - | *6.01* | *13.55* | - | - |
| මාතර | | | - | - | - | - | - | - | - |
| හම්බන්තොට | | | - | - | - | - | - | - | - |
| අම්පාර | | 48.00-48.00 | - | 48.00 | - | - | - | - | - |
| **දිග වී (රතු)** | | | | | | | | | |
| අනුරාධපුරය | | | - | - | - | - | - | - | - |
| මාතර | 50.00-52.00 | 47.00-48.00 | 51.00 | 47.60 | - | *3.40* | *7.14* | - | - |
| හම්බන්තොට | 48.00-53.00 | - | 51.00 | - | 36.90 | - | - | *14.10* | *38.21* |
| ඇඹිලිපිටිය | 51.00-53.00 | 47.00-48.00 | 52.10 | 47.40 | 35.83 | *4.70* | *9.92* | *16.27* | *45.40* |

*මූලාශ්‍රය : අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය*

## ඉල්ලුම / සැපයුම සහ මිල හැසිරීම

### සහල් තොග මිල

කොවිඩ්-19 වසංගත තත්ත්වය පාලනය කිරීම සඳහා රටපුරා අදිරිනීතිය ක්‍රියාත්මක කිරීම හේතුවෙන් අප්‍රේල් සහ මැයි මාසවල සහල් තොග වෙළෙඳපොළ අස්ථාවර තත්ත්වයක් පැවතුණි. කෙසේ නමුත් මැයි මස දෙවන සතියෙන් පමණ පසු සහල් තොග වෙළෙඳපොල ක්‍රම ක්‍රමයෙන් සාමාන්‍ය තත්ත්වයට පරිවර්තනය වීම ඇරඹුණි. සැපයුම පහළයාම සහ අවිනිශ්චිත තත්ත්වය මත සියලුම සහල් වර්ගවල සාමාන්‍ය තොග මිල 1%-6% අතර පරාසයකින් මාර්තු මාසයේ පැවති මිලට සාපේක්ෂව ඉහළ ගොස් තිබුණි.

පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සියලුම සහල් වර්ගවල තොග මිල 14%-33% අතර අගයකින් ඉහළ ගොස් තිබුණි. පසුගිය වසරට සාපේක්ෂව උපරිම මිල ඉහළයාම වූ 33% රතුකැකුළු සහල් සඳහා සටහන්ව තිබුණි.

### සහල් සිල්ලර මිල

සහල් වෙළෙඳපොල සිල්ලර මිල ඉහළයාම පාලනය කිරීමේ අරමුණින් රජය විසින් 2020 අප්‍රේල් 10 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සහල් සඳහා වූ උපරිම මිල සංශෝධනයකට ලක්කරන ලදී. පාරිභෝගික සේවා අධිකාරිය විසින් 2019 දෙසැම්බර් 19 වන දින ප්‍රකාශයට පත්කළ සහල් සඳහා වූ උපරිම මිල නියෝගයට අනුව සම්බා සහ නාඩු සහල් කිලෝවක මිල රු.98.00ක් ලෙස සටහන්ව තිබුණි. සිල්ලර වෙළෙඳපොල සහල් මිල පහත හෙළීමේ අරමුණින් 2020 අප්‍රේල් 10 දින සිට ක්‍රියාත්මක වන පරිදි සම්බා සහ නාඩු සහල් කිලෝවක උපරිම සිල්ලර මිල රු.90.00ක් ලෙස ත් සුදු සහ රතු කැකුළු සහල් කිලෝවක උපරිම මිල රු.85.00ක් ලෙසත් නියෝග පැනවිණි. කීරි සම්බා සඳහා රු.125.00 උපරිම සිල්ලර මිලක් නියම විය.

කෙසේ නමුත් බොහොමයක් සහල් වර්ගවල වෙළෙඳපොළ සැපයුමෙහි පැවති පහළයාම සැලකිල්ලට ගනිමින් සහල් සඳහා පැවති උපරිම සිල්ලර මිල 2020 මැයි 28 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි නැවත වරක් සංශෝධනය කරන ලදී. ඒ අනුව රතු සහ සුදු සම්බා කිලෝවක උපරිම සිල්ලර මිල රු.90.00සිට රු.98.00 දක්වා ඉහළ දමන ලදී. තවද, නාඩු සහ කැකුළු සහල් (රතු සහ සුදු) කිලෝවක උපරිම සිල්ලර මිල පිළිවෙළින් රු.6.00කින් සහ රු.8.00කින් ඉහළ දමන ලදී. කෙසේ නමුත් කීරි සම්බා සඳහා පැවති උපරිම සිල්ලර මිල රු.5.00ක් පහත වැටුණි.

**වගුව 1.3 : සහල් මිල (තොග සහ සිල්ලර ) – 2020 මැයි**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| සම්බා 1 | - | - | 96.90 | 96.40 | - | - | - | - |
| සම්බා 2 | 92.00-98.00 | 95.85 | 94.50 | 83.88 | *1.35* | *1.43* | *11.97* | *14.27* |
| සම්බා 3 | - | - | - | - | - | - | - | - |
| නාඩු 1 | - | - | 96.88 | 85.69 | - | - | - | - |
| නාඩු 2 | 90.00-97.00 | 94.63 | 91.15 | 82.80 | *3.47* | *3.81* | *11.83* | *14.29* |
| රතු කැකුළු | 88.00-92.00 | 90.10 | 85.20 | 67.60 | *4.90* | *5.75* | *22.50* | *33.28* |
| සුදු කැකුළු | 88.00-95.00 | 90.78 | 86.90 | 79.03 | *3.88* | *4.46* | *11.75* | *14.87* |
| ආනයනික පොන්නි සම්බා | - | - | - | - | - | - | - | - |
| ආනයනික සුදු කැකුළු | - | - | - | - | - | - | - | - |
| ආනයනික නාඩු | - | - | - | - | - | - | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| සම්බා 1 | | | 98.00 | 99.05 | | | | |
| සම්බා 2 | | | - | 92.62 | | | | |
| සම්බා 3 | | | - | - | | | | |
| නාඩු 1 | | | 98.00 | 92.83 | | | | |
| නාඩු 2 | | | - | 87.48 | | | | |
| රතු කැකුළු | | | 97.55 | 80.74 | | | | |
| සුදු කැකුළු | | | 97.98 | 87.00 | | | | |

***මූලාශ්‍රය:** අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2. අතිරේක ආහාර භෝග

## 2.1 මිරිස්

### භෝග තත්ත්වය

2020 යල කන්නය සඳහා දිවයිනේ ඉලක්කගත අමු මිරිස් වගා බිම් ප්‍රමාණය හෙක්. 6,044ක් වූ අතර මැයි මස අවසානය වන විට හෙක්. 4818ක වගාව අවසන් කර තිබුණි. එය ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් 80%කි. මැයි අවසානය වන විට ඉහළම වගා බිම් ප්‍රමාණය වූ හෙක්. 518 මොණරාගලින් වාර්තා වූ අතර අනුරාධපුර දිස්ත්‍රික්කයේ එය හෙක්. 487ක් ලෙස වාර්තා විය. කොවිඩ් වසංගත තත්ත්වය හමුවේ දිවයිනේ කෘෂිකාර්මික කටයුතු අඛණ්ඩව බාධාවකින් තොරව පවත්වාගෙන යාම සඳහා රජය විසින් ගන්නා ලද විවිධ ක්‍රියාමාර්ග මත කෘෂිකාර්මික වගා කටයුතු වල ප්‍රගතියෙහි විශාල පහළයාමක් දක්නට නොවීය. ඒ අනුව අමු මිරිස් වගා කටයුතු ද සාර්ථක මට්ටමක පැවතුණි. මෙම මස අවසානයට වගා කර ඇති අමු මිරිස් වගා බිම් ප්‍රමාණය අනුව අපේක්ෂිත නිෂ්පාදනය මෙ.ටො. 23,333ක් වන අතර ඉන් 45%ක් ම, මොණරාගල (13%), අනුරාධපුර (11%), පුත්තලම (9%), කුරුණෑගල (8%) සහ මඩකලපුව (4%) යන දිස්ත්‍රික්කවලින් අපේක්ෂිතය.

**වගුව 2.1.1: 2020 යල කන්නය සඳහා අමු මිරිස් වගාවේ ප්‍රගතිය**

| ප්‍රදේශයන් | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | 2020 මැයි මස අවසානයට වගා ප්‍රගතිය | | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|
| | | වගා බිම් ප්‍රමාණය (හෙක්.) | ඉලක්කයේ % ලෙස | |
| අනුරාධපුරය | 663 | 487 | 73.45 | 2,658 |
| පුත්තලම | 711 | 258 | 36.29 | 2,181 |
| මොණරාගල | 465 | 518 | 111.4 | 3,104 |
| යාපනය | 200 | 125 | 62.5 | 445 |
| බදුල්ල | 264 | 150 | 56.82 | 628 |
| අම්පාර | 158 | 125 | 79.11 | 495 |
| මඩකලපුව | 351 | 326 | 92.88 | 1,064 |
| කුරුණෑගල | 349 | 444 | 127.22 | 1,941 |
| කිලිනොච්චිය | 200 | 121 | 60.5 | 181 |
| අනෙකුත් ප්‍රදේශ | 2,683 | 2,264 | 84.38 | 10,636 |
| එකතුව | 6,044 | 4,818 | 79.72 | 23,333 |

*මූලාශ්‍රය : භෝග පුරෝකථන වාර්තාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

### ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

අමු මිරිස් තොග මිල කිලෝවක් රු.12.00කින් පමණ ඉහල ගොස් ඇත. සැපයුමෙහි යම් ගැටළු සහගත තත්ත්වයන් මේ සඳහා හේතු විය. අමු මිරිස් කිලෝවක තොග මිල රු.70.00-160.00 වශයෙන් වාර්තා විය. පසුගිය වසරට සාපේක්ෂව අමු මිරිස් තොග මිල 14%කින් පමණ පහළ ගොස් තිබුණි. 2020 මැයි මාසය තුළ වියළි මිරිස් මෙ.ටො. 3,388ක් ආනයනය කර ඇති අතර ආනයනික මිල කිලෝවකට රු.364.18ක් වශයෙන් පැවතුණි. ආනයනික වියළි මිරිස් තොග මිල කිලෝවක් රු.5.00කින් පමණ පහළ ගොස් ඇති අතර තොග වෙළෙඳපොළේ ආනයනික වියලි මිරිස් කිලෝවක් රු.350.00-450.00 අතර පරාසයක පැවතුණි. පසුගිය වසරේ සමාන කාලයට සාපේක්ෂව ආනයනික වියළි මිරිස් තොග මිල 47%කින් ඉහළ ගොස් ඇත.

### වගුව 2.1.2 : වියළි මිරිස් හා අමු මිරිස් තොග සහ සිල්ලර මිල - 2020 මැයි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | කි. ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | % |
| තොග මිල | | | | | | | | |
| අමු මිරිස් | 70.00-160.00 | 126.33 | 114.50 | 147.00 | *11.83* | *10.33* | *-20.67* | *-14.06* |
| වියළි මිරිස් (ආනයනික) | 350.00-450.00 | 389.79 | 394.57 | 264.59 | *-4.78* | *-1.21* | *125.20* | *47.32* |
| සිල්ලර මිල | | | | | | | | |
| අමු මිරිස් | - | - | 272.99 | 323.20 | - | - | - | - |
| වියළි මිරිස් (ආනයනික) | - | - | 592.69 | 328.50 | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 2.1.3:වියළි මිරිස්වල ආනයනික මිල තොග සහ සිල්ලර මිල (කි.ග්‍රෑ.රු) 2019 දෙසැම්බර් - 2020 මැයි

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ) (කි.ග්‍රෑ.රු.) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය* (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| මැයි 2020 | 3,388 | 1234.13 | 364.18 | - | - |
| අප්‍රේල්. 2020 | 6,175 | 2325.4 | 376.6 | - | - |
| මාර්තු 2020 | 4,854 | 1,677.40 | 345.56 | 592.69 | 247.12 |
| පෙබරවාරි. 2020 | 5,131 | 1,987.40 | 387.33 | 616.91 | 229.58 |
| ජනවාරි 2020 | 3,080 | 1,192.40 | 387.11 | 568.88 | 181.77 |
| දෙසැම්බර් 2019 | 5,178 | 1,906.70 | 368.21 | 518.89 | 150.68 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*
*අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*
*(මි.ර.ගැ. = මිල, රක්ෂණය සහ ගැල් කුලී)*
* සිල්ලර මිල - ආනයනික මිල

### වගුව 2.1.4 : අමු මිරිස් සඳහා ගොවියාට ලැබුණු මිල (කි.ග්‍රෑ.රු.) - 2020 මැයි

| ප්‍රදේශය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය |
|---|---|---|---|---|
| දඹුල්ල | | 75.60 | 69.20 | 67.20 |
| හම්බන්තොට | | - | - | - |
| ඇඹිලිපිටිය | | 182.00 | 186.00 | 195.00 |
| පුත්තලම | | - | 90.00 | 125.00 |
| අනුරාධපුර | | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.2 ලොකුළූණු සහ රතුළූණු

### භෝග තත්ත්වය

2020 යල කන්නය සඳහා ඉලක්කගත ලොකුළූණු බිම් ප්‍රමාණය හෙක්.3,312ක් වූ අතර ඉන් හෙක්.879ක් මැයි මස අවසන් වන විට වගා කර තිබුණි. එය ඉලක්කගත ලොකු ළූණු බිම් ප්‍රමාණයෙන් 26%කි. කෙසේ නමුත් යල කන්නය සඳහා ලොකුළූණු වගා කටයුතු ජූලි මාසය අවසානය දක්වාම සිදු වනු ඇත. මාතලේ දිස්ත්‍රික්කය තුළ ඉලක්කගත ලොකුළූණු බිම් ප්‍රමාණය හෙක්.981ක් වශයෙන් වාර්තා වූ අතර මැයි මාසය අවසන් වන විට වගා කර තිබුණේ හෙක්.59ක් පමණි. එය එම දිස්ත්‍රික්කයේ ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් 6%කි. අනුරාධපුර දිස්ත්‍රික්කය තුළ ලොකුළූණු වගා ප්‍රගතිය සාර්ථක මට්ටමක පැවතුණු අතර මෙම මාසය අවසන් වන විට හෙක්. 246ක වගාව සිදු කර තිබුණි.

## වගුව 2.2.1: 2020 යල කන්නය සඳහා ලොකුළූණු වගාවේ ප්‍රගතිය

| ප්‍රදේශයන් | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | 2020 මැයි මස අවසානයට වගා ප්‍රගතිය | | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|
| | | වගා බිම් ප්‍රමාණය (හෙක්.) | ඉලක්කයේ % ලෙස | |
| මාතලේ | 981 | 59 | 6 | 1,528 |
| අනුරාධපුර | 352 | 246 | 69 | 3,787 |
| මහවැලි H | 250 | 126 | 50 | 1,890 |
| මහවැලි H[1] | 1,287 | 219 | 17 | 3,285 |
| වෙනත් ප්‍රදේශ | 442 | 229 | 51 | 3,752 |
| එකතුව | 3,312 | 879 | 26 | 14,242 |

*මූලාශ්‍රය : භෝග පුරෝකථන වාර්තාව 2020 -01, සමාජ ආර්ථික සැලසුම් ඒකකය ,කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

මෙවර යල කන්නය සඳහා රතුළූණු වගා ඉලක්කය හෙක්.4,807ක් වූ අතර මැයි මාසය අවසන් වන විට හෙක්.1,345ක් වගා කර තිබුණි. එය ඉලක්කයෙන් 27%ක ප්‍රතිශතයකි. ඉහළම ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්. 2000) හා ඉහළම වගා බිම් ප්‍රමාණය (හෙක් .695) වාර්තා වූයේ යාපනය දිස්ත්‍රික්කයෙනි. මෙතෙක් වගා කර ඇති බිම් ප්‍රමාණය අනුව අපේක්ෂිත රතුළූණු අස්වැන්න මෙ.ටො.1,5307ක් වූ අතර ඉන් 72%ක් ම යාපනය (44%) හා පුත්තලම (28%) යන දිස්ත්‍රික්ක දෙකෙන් පමණක් සැපයේ. කොවිඩ් වසංගතය හමුවේ කෘෂිකාර්මික කටයුතු බාධාවකින් තොරව පවත්වාගෙන යාමට රජය විසින් ගත් විවිධ ක්‍රියාමාර්ග අනුව ලොකුළූණු හා රතුළූණු වගාවට ද විශාල බාධාවක් සිදු නොවීය.

## වගුව 2.2.2: 2020 යල කන්නයට අදාළව රතුළූණු වගාවේ ප්‍රගතිය

| ප්‍රදේශයන් | ඉලක්කගත බිම් ප්‍රමාණය (හෙක්.) | 2020 යල මස අවසානයට වගා ප්‍රගතිය | | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|
| | | වගා බිම් ප්‍රමාණය (හෙක්.) | ඉලක්කයේ % ලෙස | |
| යාපනය | 2,000 | 695 | 34.8 | 6,859 |
| පුත්තලම | 740 | 235 | 31.8 | 4,318 |
| ත්‍රිකුණාමලය | 656 | 79 | 12 | 621 |
| අනෙකුත් ප්‍රදේශ | 1,411 | 336 | 23.8 | 3,509 |
| **එකතුව** | **4,807** | **1,345** | **28** | **15,307** |

*මූලාශ්‍රය : භෝග පුරෝකථන වාර්තාව, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

## ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

2020 මැයි මාසය තුල ලොකුළූණු මෙ.ටො.17,954ක් ආනයනය කර තිබුණු අතර ආනයනික මිල රු.42.61ක් වශයෙන් වාර්තා විය. 2020 මැයි 01 දින සිට රජය මඟින් ලොකුළූණු සඳහා විශේෂ වෙළඳ භාණ්ඩ බද්ද රු.15.00ක වශයෙන් මාස 2කට වලංගු වන ලෙස පනවන ලදී. ආනයනික ලොකුළූණු තොග මිල රු.80.00කින් පමණ ලෙස පහළ ගොස් ඇති අතර තොග ප්‍රමාණවත් පරිදි පැවතීම ඒ සඳහා හේතු විය. ආනයනික ලොකුළූණු තොග මිල රු.50.00-75.00 අතර පරාසයක වෙළෙඳපොළ තුළ පැවතුණි. පසුගිය වසරට සාපේක්ෂව ආනයනික ලොකුළූණු මිල 10%කින් පමණ පහළ ගොස් ඇත.

සිනන් වර්ගයේ රතුළූණු සඳහා තොග මිල කිලෝවක් රු.62.00කින් පමණ ඉහළ ගොස් ඇත. ප්‍රධාන නිෂ්පාදන ප්‍රදේශවලින් තොග සැපයුම පහළයාම මේ සඳහා හේතු වූ අතර සිනන් කිලෝවක් රු.250.00-280.00 අතර පරාසයක පැවතුණි. රතුළූණු මෙ.ටො.1,275ක් මෙම මාසය තුළ ආනයනය කර ඇති අතර ආනයනික මිල රු.168.21ක් වශයෙන් පැවතුණි. ආනයනික රතුළූණු තොග මිල ද රු.50.00කින් පමණ ඉහළ ගොස් ඇති අතර තොග මිල රු.250.00-280.00 අතර පරාසයක පැවතුණි. පසුගිය වසරට සාපේක්ෂව

සිනන් හා ආනයනික රතුළූණු තොග මිල ගණන් පිළිවෙළින් 237%කින් හා 81%කින් පමණ ඉහළ ගොස් ඇත.

## වගුව 2.2.3: රතු ලූනු සහ ලොකුළූනුණු තොග සහ සිල්ලර මිල (කි.ග්‍රෑ.රු) 2020 - මැයි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු | % |
| **තොග මිල** | | | | | | | | |
| රතුළූණු(සිනන්) | 250.00-280.00 | 262.83 | 200.78 | 78.10 | *62.06* | *30.91* | *184.74* | *236.55* |
| රතුළූණු(වේදාලන්) | - | - | - | 135.92 | - | - | - | - |
| රතුළූණු (ආනයනික) | 250.00-280.00 | 265.00 | 215.25 | 146.71 | *49.75* | *23.11* | *118.29* | *80.62* |
| ලොකුළූණු(ආනයනික) | 50.00-75.00 | 57.53 | 137.75 | 64.05 | *-80.22* | *-58.23* | *-6.51* | *-10.17* |
| ලොකුළූණු (දේශීය) | - | - | - | - | - | - | - | - |
| **සිල්ලර මිල** | | | | | | | | |
| රතුළූණු (සිනන්) | - | - | 325.00 | 163.86 | - | - | - | - |
| රතුළූණු (වේදාලන්) | - | - | - | 201.43 | - | - | - | - |
| රතුළූණු (ආනයනික) | - | - | 371.19 | - | - | - | - | - |
| ලොකුළූණු ආනයනික) | - | - | 182.10 | 93.54 | - | - | - | - |
| ලොකුළූණු (දේශීය) | - | - | - | - | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## වගුව 2.2.4: ආනයනික ළූණුවල මාසික සාමාන්‍ය ආනයනික මිල (මි.ර.ගැ) තොග සහ සිල්ලර මිල

| භෝගය | මාසය | ආනයනික මිල (මි.ර.ගැ.) (කි.ග්‍රෑ.රු.) | තොග මිල (කි.ග්‍රෑ.රු.) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | තොග මිල -ආනයනික මිල | සිල්ලර මිල-තොග මිල |
| ලොකුළූණු | මැයි 2020 | 42.61 | 57.53 | - | *14.92* | - |
| | අප්‍රේල් 2020 | 72.04 | - | - | - | - |
| | මාර්තු 2020 | 79.14 | 137.75 | 182.10 | *58.61* | *44.35* |
| | මැයි 2019 | 48.08 | 64.05 | 93.54 | *15.97* | *29.50* |
| රතුළූණු | මැයි 2020 | 168.21 | 265.00 | - | *96.79* | - |
| | අප්‍රේල් 2020 | 178.41 | - | - | - | - |
| | මාර්තු 2020 | 175.19 | 215.25 | 371.19 | *40.06* | *155.94* |
| | මැයි 2019 | 115.33 | 146.71 | - | *31.38* | - |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## වගුව 2.2.5: රතුළූණු සහ ලොකුළූණු ආනයනික ප්‍රමාණය, වටිනාකම සහ ආනයනික මිල

| භෝගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (රු.දශ ලක්ෂ) | | | ආනයනික මිල මි.ර.ගැ. (කි.ග්‍රෑ.රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | මැයි 2020 | අප්‍රේල් 2020 | මාර්තු 2020 | මැයි 2020 | අප්‍රේල් 2020 | මාර්තු 2020 | මැයි 2020 | අප්‍රේල් 2020 | මාර්තු 2020 |
| රතුළූණු | 1,275 | 104 | 496 | 214.40 | 18.50 | 87 | 168.21 | 178.41 | 175.19 |
| ලොකුළූණු | 17,954 | 30475 | 33,496 | 765 | 2195.43 | 2,651.10 | 42.61 | 72.04 | 79.14 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

**වගුව 2.2.6 : ආනයනික ලොකුළූණු වල ආනයනික මිල (මි.ර.ගැ.) තොග සහ සිල්ලර මිල 2019 දෙසැම්බර් - 2020 මැයි**

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | ආනයනික මිල මි.ර.ගැ. ( කි.ග්‍රෑ.රු.) | තොගමිල කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල කි.ග්‍රෑ.රු. | දළ ආන්තිකය* කි.ග්‍රෑ.රු. |
|---|---|---|---|---|---|
| මැයි 2020 | 17,954 | 42.61 | 57.53 | - | - |
| අප්‍රේල් 2020 | 30,475 | 72.04 | - | - | - |
| මාර්තු 2020 | 33,496 | 79.14 | 137.75 | 182.10 | 102.95 |
| පෙබ. 2020 | 16,421 | 91.81 | 140.63 | 187.64 | 95.83 |
| ජන. 2020 | 22,634 | 96.13 | 100.21 | 158.34 | 62.22 |
| දෙසැ. 2019 | 29,000 | 101.53 | 126.44 | 178.67 | 77.15 |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*
**සිල්ලර මිල - ආනයනික මිල*

## 2.3 අර්තාපල්

### භෝග තත්ත්වය

නුවරඑළිය සහ බදුල්ල දිස්ත්‍රික්ක දෙකෙහි ම යල කන්නය සඳහා වගා කටයුතු ආරම්භව පැවතුණි. 2020 යල කන්නය සඳහා ඉලක්කගත අර්තාපල් වගා බිම් ප්‍රමාණය හෙක්. 2,917 වූ අතර මැයි මාසය අවසන් වන විට හෙක්. 370ක් වගා කර තිබුණි. එය ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් 13%කි. මැයි මස අග වන විට වගා කර ඇති මුළු බිම් ප්‍රමාණය සැලකීමේදී මෙම යල කන්නය සඳහා අපේක්ෂිත අර්තාපල් නිෂ්පාදනය මෙ.ටො. 7,162කි.

නුවරඑළිය දිස්ත්‍රික්කයෙහි මෙම යල කන්නය සඳහා ඉලක්කගත බිම් ප්‍රමාණය හෙක්. 854ක් වූ අතර බදුල්ල දිස්ත්‍රික්කය සඳහා එය හෙක්. 2,063ක් විය. මැයි මස අවසන් වන විට දිස්ත්‍රික්ක දෙකෙහි පිළිවෙලින් හෙක්. 228ක් හා හෙක්. 142ක් වගා කර තිබූ අතර එය ඉලක්කගත බිම් ප්‍රමාණයෙන් පිළිවෙළින් 27% හා 7%ක් බැගින් විය. බදුල්ල දිස්ත්‍රික්කයෙහි යල කන්නය සඳහා වගා කටයුතු වී අස්වැන්න නෙලා අවසන් වීමෙන් පසුව වන හෙයින් ඉදිරි මාසවලදී අර්තාපල් සඳහා වගා කටයුතු වැඩි වශයෙන් අපේක්ෂා කෙරේ. ක්ෂේත්‍ර තොරතුරුවලට අනුව බදුල්ල දිස්ත්‍රික්කයෙහි වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය තුළ කැප්පෙටිපොළ, බෝගහකුඹුර, බොරලන්ද, අඹගස්දූව හා ඌවපරණගම ප්‍රදේශවල මහ කන්නයට අදාළ අර්තාපල් සඳහා අස්වනු නෙලීම් කටයුතු ජුනි මාසය වන විට අවසන් වනු ඇත. පසුගිය යල කන්නයෙහි සමාන කාලයට සාපේක්ෂව මෙම යල කන්නයෙහි නුවරඑළිය දිස්ත්‍රික්කය තුළ මේ දක්වා වගා කොට ඇති බිම් ප්‍රමාණය ඉහළ මට්ටමක පවතින අතර බදුල්ල දිස්ත්‍රික්කයෙහි එය අඩු මට්ටමක පවතී.

**වගුව 2.3.1: අර්තාපල් සඳහා මැයි මස අවසානයට වගා ප්‍රගතිය සහ අපේක්ෂිත නිෂ්පාදනය (2020 යල කන්නය)**

| දිස්ත්‍රික්කය | වගා ඉලක්කය (හෙක්) | | වගා ප්‍රගතිය (හෙක්) | | ප්‍රගතිය (%) 2020 යල | අපේක්ෂිත නිෂ්පාදනය (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|
| | **2019 යල** | **2020 යල** | **2019 යල** | **2020 යල** | | |
| නුවරඑළිය | 884 | 854 | 112 | 228 | 27 | 4,634 |
| බදුල්ල | 2,157 | 2,063 | 359 | 142 | 7 | 2,528 |
| ශ්‍රී ලංකාව | **3,049** | **2,917** | **471** | **370** | **13** | **7,162** |

*මූලාශ්‍රය: අලෙවි ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙක්ටර් කොබ්බෑකඩුව ගොවිකටයුතු පර්යේෂණ හා පුහුණු කිරීමේ ආයතනය*
*භෝග පුරෝකථන වාර්තාව 2020 යල කන්නය, සමාජ ආර්ථික සහ සැලසුම් අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*
**භෝග පුරෝකථන වාර්තාව, 2019 යල කන්නය, සමාජ ආර්ථික සහ සැලසුම් අංශය, කෘෂිකර්ම දෙපාර්තමේන්තුව*

## ඉල්ලුම/ සැපයුම සහ මිල හැසිරීම

පසුගිය මාසවල පැවති කොවිඩ් -19 ගෝලීය වසංගත තත්ත්වය හමුවේ මාර්තු සිට මැයි දක්වා කාලය තුළ රටතුළ ඇඳිරිනීතිය හා ලොක්ඩවුන් තත්ත්වයක් පැවතිය ද අත්‍යවශ්‍ය ආහාර සඳහා ප්‍රමාණවත් සැපයුම් වෙළඳපොළ තුළ අඛණ්ඩව දක්නට ලැබුණි. රජය විසින් තෝරාගත් ප්‍රධාන ආහාර ද්‍රව්‍ය 14ක් සඳහා සහතික කළ මිල ගණන් (අර්තාපල් -කිලෝවකට රු.100.00) ප්‍රකාශ කිරීම, කෘෂි රක්ෂණය, සහනදායී කෘෂි යෙදවුම් වැනි වැඩසටහන් ගොවීන්ට හඳුන්වා දුන් අතර ඒ හේතුවෙන් බාධාවකින් තොරව වගා කටයුතු කරගෙන යාමට ගොවීන්ට අවස්ථාව සැලසී තිබුණි. එසේම, පාරිභෝගිකයන්ට අත්‍යවශ්‍ය ආහාර ද්‍රව්‍ය ලබාදීම සඳහා එම ද්‍රව්‍ය බෙදාහැරීමේ කටයුතු ද විධිමත් පරිදි පවත්වාගෙන යාම මඟින් වෙළෙඳපොළ තුළ අර්තාපල් වැනි භෝග සඳහා හිඟයක් දක්නට නොලැබුණි.

මැයි මාසයේදී අර්තාපල් මෙ.ටො. 3,948ක් ආනයනය කොට තිබුණි. 2019 මැයි මාසයට (මෙ.ටො. 12,591) සාපේක්ෂව මෙම මාසයේදී ආනයනික තොග ප්‍රමාණය අඩු මට්ටමක පැවතුණි. මැයි මාසයේදී අර්තාපල් සඳහා සාමාන්‍ය ආනයනික මිල කිලෝවකට රු.58.00ක් විය. ආනයනික අර්තාපල් සඳහා විශේෂිත ආනයනික බද්ද 2020/05/21 දින සිට ක්‍රියාත්මක වන පිරිදි කිලෝවකට රු.50.00 දක්වා ඉහළ දමන ලදී.

මැයි මාසයේදී වෙළෙඳපොළ තුල දේශීය හා ආනයනික අර්තාපල් තොග දක්නට ලැබුණි. දේශීය අර්තාපල් සැලකීමේදී වැලිමඩ අර්තාපල් සඳහා ප්‍රධාන අස්වනු සමය (මහ කන්නයේ) අවසන් වෙමින් පැවතීම හේතුවෙන් සීමිත තොග දක්නට ලැබුණි. මැයි මාසයේදී නුවරඑළිය අර්තාපල් සඳහා සාමාන්‍ය ගොවිපල මිල කිලෝවකට රු.131.00ක් විය. නුවරඑළිය අර්තාපල් සඳහා තොග සැපයුම් ද අඩු මට්ටමක පැවතුනි. එමනිසා, කොළඹ තොග වෙළෙඳපොළ තුළ වැලිමඩ සහ නුවරඑළිය අර්තාපල් සඳහා තොග මිල ගණන් මාර්තු මාසයට සාපේක්ෂව පිළිවෙළින් 9% සහ 6% ඉහළ ගොස් තිබුණි. මේ අතර ආනයනික අර්තාපල් සඳහා මිල ගණන් ද මැයි මාසයේදී මාර්තු මාසයට සාපේක්ෂව 19%ක ඉහළයාමක් පෙන්නුම් කරන ලදී. මැයි මාසයේදී වැලිමඩ, නුවරඑළිය සහ ආනයනික අර්තාපල් සඳහා තොග මිල පරාසය කිලෝවකට පිළිවෙළින් රු.110.00-120.00, රු.120.00-140.00 සහ රු.85.00-140.00 අතර අගයක පැවතුණි.

### වගුව 2.3.2: අර්තාපල් ආනයනික ප්‍රමාණය, වටිනාකම සහ මිල (2019 දෙසැම්බර් - 2020 මැයි)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ) කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| මැයි 2020 | 3,948 | 230.37 | 58.36 | - | - |
| අප්‍රේල් 2020 | 13,269 | 837.34 | 63.11 | - | - |
| මාර්තු.2020 | 11,527 | 624.42 | 54.17 | 129.89 | *75.72* |
| පෙබ.2020 | 16,999 | 887.45 | 52.21 | 138.17 | *85.97* |
| ජන. 2020 | 14,651 | 815.84 | 55.69 | 137.70 | *82.01* |
| දෙසැ.2019 | 14,946 | 927.49 | 62.06 | 159.39 | *97.34* |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## වගුව 2.3.3 : අර්තාපල් සඳහා ගොවියාට ලැබුණු මිල, තොග මිල හා සිල්ලර මිල 2020 මැයි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2020 මැයි** | **2020 මැයි** | **2020 මාර්තු** | **2019 මැයි** | **2020 මාර්තු** | | **2019 මැයි** | |
| | කි.රු.ග්‍රෑ. | කි.රු.ග්‍රෑ. | කි.රු.ග්‍රෑ. | කි.රු.ග්‍රෑ. | කි.රු.ග්‍රෑ. | % | කි.රු.ග්‍රෑ. | % |
| **ගොවිපල මිල (1)** | | | | | | | | |
| වැලිමඩ | 120.00-150.00 | 132.00 | 106.88 | - | *25.13* | *23.51* | - | - |
| නුවරඑළිය | 125.00-140.00 | 131.00 | 99.90 | 124.05 | *31.10* | *31.13* | *6.95* | *5.60* |
| ආනයනික | 56.33-78.57 | 58.36 | 54.17 | 37.23 | *4.19* | *7.73* | *21.13* | *56.75* |
| **තොග මිල (2)** | | | | | | | | |
| වැලිමඩ | 110.00-120.00 | 115.50 | 105.50 | - | *10.00* | *9.48* | - | - |
| නුවරඑළිය | 120.00-140.00 | 133.00 | 125.63 | 145.92 | *7.38* | *5.87* | *-12.92* | *-8.86* |
| ආනයනික | 85.00-140.00 | 101.17 | 85.25 | 94.85 | *15.92* | *18.67* | *6.32* | *6.66* |
| **සිල්ලර මිල (3)** | | | | | | | | |
| වැලිමඩ | - | - | - | - | - | - | - | - |
| නුවරඑළිය | - | - | 196.08 | 200.97 | - | - | - | - |
| ආනයනික | - | - | 129.89 | 125.23 | - | - | - | - |
| **දළ ආන්තිකය (3-1)** | | | | | | | | |
| වැලිමඩ | | - | - | - | - | - | - | - |
| නුවරඑළිය | | - | 96.18 | 76.92 | - | - | - | - |
| ආනයනික | | - | 75.72 | 88.00 | - | - | - | - |
| **දළ ආන්තිකය (3-2)** | | | | | | | | |
| වැලිමඩ | | - | - | - | - | - | - | - |
| නුවරඑළිය | | - | 70.45 | 55.04 | - | - | - | - |
| ආනයනික | | - | 44.64 | 30.38 | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.4 මුංඇට සහ කව්පි

### භෝග තත්ත්වය සහ ප්‍රගතිය

කෘෂිකර්ම දෙපාර්තමේන්තුව විසින් පලකරනු ලැබූ නවතම භෝග පුරෝකථන වාර්තාවට අනුව මැයි මස අවසානයේ 2020 යල කන්නයේ ඉලක්කගත මුං ඇට වගා බිම් ප්‍රමාණයෙන් 56%ක් ලඟා කරගෙන ඇත. වගුඅංක 2.4.1 අනුව, පසුගිය යල කන්නය, එනම් 2019 යල කන්නය හා සසඳා බැලීමේදී, මෙම කන්නය තුළ දැනට වගාකොට ඇති බිම් ප්‍රමාණය හෙක්. 5,379 න් ඉහළ ගොස් ඇත. ශ්‍රී ලංකාවේ අපේක්ෂිත මුළු මුං ඇට නිෂ්පාදනය මෙ.ටො. 9,557ක් වන අතර එය පසුගිය යල කන්නයේ නිෂ්පාදනයට වඩා 78% ක ඉහළයාමකි.

### වගුව 2.4.1 : මුංඇට සහ කව්පි සඳහා වගා ප්‍රගතිය සහ අපේක්ෂිත නිෂ්පාදනය (2020 යල කන්නය)

| භෝගය | දිස්ත්‍රික්කය | වගා ඉලක්කය (හෙක්.) | | වගා ප්‍රගතිය (හෙක්.) | | වගා ප්‍රගතිය (%) | අපේක්ෂිත අස්වැන්න (මෙ.ටො.) |
|---|---|---|---|---|---|---|---|
| | | **2019 යල** | **2020 යල** | **2019 යල** | **2020 යල** | **2020 යල** | |
| මුංඇට | හම්බන්තොට | 652 | 406 | 72 | 579 | 142.6 | 832 |
| | මොණරාගල | 632 | 615 | 161 | 1,023 | 166.3 | 978 |
| | කුරුණෑගල | 923 | 689 | 92 | 1,012 | 146.9 | 1,238 |
| | අනිකුත් දිස්ත්‍රික්ක | 3,757 | 10,668 | 1,182 | 4,272 | 40 | 6,509 |
| | ශ්‍රීලංකාව | **5,964** | **12,378** | **1,507** | **6,886** | **55.6** | **9,557** |
| කව්පි | අම්පාර | 3,388 | 3,271 | 806 | 1,724 | 52.7 | 2,044 |
| | මොණරාගල | 566 | 599 | 474 | 2,046 | 341.6 | 2,368 |
| | අනුරාධපුරය | 213 | 601 | 65 | 540 | 89.9 | 732 |
| | අනිකුත්දිස්ත්‍රික්ක | 2,509 | 2,466 | 763 | 3,313 | 134.3 | 4,667 |
| | ශ්‍රීලංකාව | **6,676** | **6,937** | **2,108** | **7,623** | **109.9** | **9,811** |

*මූලාශ්‍රය: භෝගපුරෝකථනවාර්තාව, 2019/20 යල කන්නය, සමාජ - ආර්ථික ඒකකය / කෘෂිකර්මදෙපාර්තමේන්තුව*

2020 යල කන්නයේ ඉලක්ක ගත කව්පි බිම් ප්‍රමාණයෙන් 110% ලඟා කරගෙන ඇති අතර එයින් මෙ.ටො. 9,811 ක අස්වැන්නක් අපේක්ෂා කරනු ලැබේ. අම්පාර, මොණරාගල සහ අනුරාධපුරය යන දිස්ත්‍රික්ක කව්පි වගා කරනු ලබන ප්‍රධාන දිස්ත්‍රික්ක වන අතර රටේ මුළු නිෂ්පාදනයෙන් 52% ක අස්වැන්නක් ද ලබා දෙනු ලැබේ. මොණරාගල, අනුරාධපුරය හා අම්පාර යන දිස්ත්‍රික්කයන් වඩා හොඳ වගා ප්‍රගතියක් ද පෙන්නුම් කරනු ලබයි.

## ඉල්ලුම/ සැපයුම සහ මිලෙහි හැසිරීම

මැයි මාසය තුළ මුං ඇට තොග මිල කිලෝවකට රු. 270.00-310.00 ක පරාසයක් තුළ විහිදී තිබුණු අතර, එහි සාමාන්‍ය මිල කිලෝවකට රු. 282.00 ක් ලෙස වාර්තා විය. මාර්තු මාසයට සාපේක්ෂව මුං ඇට සාමාන්‍ය තොග මිල 8% කින් ඉහළ ගොස් ඇත. මේ හා සමානවම පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී මුං ඇට සාමාන්‍ය තොග මිල 12% කින් ඉහළ ගොස් ඇත.

**වගුව : 2.4.2: මුංඇට සහ කව්පි තොග සහ සිල්ලර මිල - 2020 මැයි**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | % | (කි.ග්‍රෑ.රු.) | % |
| **තොග මිල** | | | | | | | | |
| මුංඇට | 270.00-310.00 | 281.67 | 259.50 | 251.97 | *22.17* | *8.54* | *29.69* | *11.78* |
| කව්පි ( සුදු) | 265.00-310.00 | 288.53 | 264.25 | 217.71 | *24.28* | *9.19* | *70.82* | *32.53* |
| කව්පි (රතු) | 265.00-310.00 | 288.47 | 276.50 | 248.36 | *11.97* | *4.33* | *40.12* | *16.15* |
| **සිල්ලර මිල** | | | | | | | | |
| මුංඇට | - | - | 300.75 | 277.49 | - | - | - | - |
| කව්පි (සුදු) | - | - | 304.89 | 276.49 | - | - | - | - |
| කව්පි (රතු) | - | - | 308.19 | 300.82 | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

මැයි මාසය තුළ සුදු සහ රතු කව්පි සඳහා සාමාන්‍ය තොග මිල කිලෝවකට රු. 288.00 ක් ලෙස වාර්තා විය. සුදු සහ රතු කව්පි තොග මිල කිලෝවකට රු.265.00-310.00 ක පරාසයක් තුළ සටහන් විය. මාර්තු මාසයට සාපේක්ෂව, සුදු කව්පි තොග මිල 9%කින් ඉහළ ගොස් ඇති අතර රතු කව්පි මිල 4% කින් පමණ ඉහළ ගොස් ඇත. පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී සුදු කව්පි තොග මිල 32% කින් ඉහළ ගොස් ඇති අතර රතු කව්පි තොග මිල 16% කින් ඉහළ ගොස් ඇත.

මෙම මස තුළ මුං ඇට මෙ.ටො. 990 ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර, එය මාර්තු මාසයේ ආනයනය කරන ලද ප්‍රමාණය හා සැසඳීමේදී 36% න් පහළ ගොස් ඇත. මුං ඇට කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.192.65 ක් ලෙස සටහන් වූ අතර, එය පසුගිය මාර්තු මාසයේ වාර්තා වූ මිලට සාපේක්ෂව 6% න් ඉහළ ගොස් ඇත. මුං ඇට ආනයනික තොගය සඳහා වැය වූ මුළු මුදල රුපියල් දශලක්ෂ 190.66 ක් ලෙස වාර්තා වූ අතර, එය පසුගිය මාර්තු මාසයේ මුං ඇට ආනයනය සඳහා වැය වූ මුදලට සාපේක්ෂව 32% ක අඩු වීමකි. මෙම මාසය තුළ ආනයනය කරන ලද මුං ඇට තොගයෙන් 46% ක් මියන්මාර් වලින් ද 25% ක් වෙනිසියුලාවෙන් ද 12% ක් ආජන්ටිනාවෙන් ද 7% ඕස්ට්‍රේලියාවෙන් ද 5% තායිලන්තයෙන් ද සහ දකුණු අප්‍රිකාවෙන් 5% ආනයනය කර ඇත.

### වගුව 2.4.3 : ආනයනික මුංඇට ප්‍රමාණය, වටිනාකම සහ ආනයනික මිල (මි.ර.ගැ)
### (2019 දෙසැම්බර් -2020 මැයි දක්වා)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ.) (කි.ග්‍රෑ.රු.) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| මැයි 2020 | 990 | 190.66 | 192.65 | - | - |
| අප්‍රේල් 2020 | 926 | 187.29 | 202.34 | - | - |
| මාර්තු 2020 | 1,536 | 280.27 | 182.45 | 300.75 | 118.30 |
| පෙබ. 2020 | 2,716 | 518.28 | 190.83 | 300.45 | 109.62 |
| ජන. 2020 | 1,229 | 225.41 | 183.35 | 302.03 | 118.67 |
| දෙසැ. 2019 | 723 | 123.29 | 170.53 | 282.54 | 112.01 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

මැයි මාසය තුළ කව්පි මෙ.ටො. 344 ක ප්‍රමාණයක් ආනයනය කර ඇති අතර එය පසුගිය මාර්තු මාසයේ ආනයනය කරන ලද ප්‍රමාණයට වඩා 56% ක පහළයාමකි. කව්පි කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.164.00 ක් ලෙස වාර්තා විය. කව්පි ආනයනික පිරිවැය පසුගිය මාර්තු මාසයට සාපේක්ෂව 52% කින් පමණ පහළ ගොස් ඇත. වගු අංක 2.4.4 අනුව, කව්පි ආනයනය සඳහා මේ මස වැය වූ මුදල දළ වශයෙන් රු.මිලියන 56 ක් පමණ වේ. මුළු කව්පි ආනයනික තොගය ඉන්දියාවෙන් (52%), මියන්මාරයෙන් (42%) සහ මැඩගස්කර් වලින් (6%) ආනයනය කර ඇත.

### වගුව 2.4.4 : ආනයනික කව්පි (සුදු) ප්‍රමාණය, වටිනාකම සහ ආනයනික මිල (මි.ර.ගැ)
### (2019 දෙසැම්බර් - 2020 මැයි දක්වා)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ.) කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| මැයි 2020 | 344 | 56.38 | 163.93 | - | - |
| අප්‍රේල් 2020 | 884 | 150.91 | 170.72 | - | - |
| මාර්තු 2020 | 780 | 117.76 | 150.95 | 304.89 | 153.94 |
| පෙබ. 2020 | 495 | 76.79 | 155.17 | 303 | 147.83 |
| ජන. 2020 | 413 | 58.56 | 141.81 | 297.64 | 155.82 |
| දෙසැ. 2019 | 510 | 69.28 | 135.91 | 285.97 | 150.05 |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### 2.4.5: මුංඇට සහ කව්පි සඳහා මාසික සාමාන්‍ය ආනයනික මිල, තොග මිල, සහ සිල්ලර මිල

| භෝගය | මාසය | ආනයනික මිල (මි.ර.ගැ.) කි.ග්‍රෑ.රු. | තොග මිල | සිල්ලර මිල | ආන්තිකය ( කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | තොග මිල -ආනයනික මිල (මි.ර.ගැ.) | සිල්ලර මිල - තොග මිල |
| මුංඇට | මාර්තු 2020 | 192.65 | 281.67 | - | 77.05 | 41.25 |
| | පෙබ. 2020 | 202.34 | - | - | - | - |
| | මාර්තු 2019 | 182.45 | 259.50 | 300.75 | 81.55 | 28.07 |
| | අප්‍රේල්2020 | 177.22 | 251.97 | 277.49 | 79.72 | 21.63 |
| සුදු කව්පි | මාර්තු 2020 | 163.93 | 288.53 | - | 113.3 | 40.64 |
| | පෙබ. 2020 | 170.72 | - | - | - | - |
| | මාර්තු 2019 | 155.17 | 264.25 | 304.89 | 102.21 | 45.63 |
| | අප්‍රේල් 2020 | 123.47 | 217.71 | 276.49 | 104.97 | 57.31 |
| රතු කව්පි | මාර්තු 2020 | - | 288.47 | - | - | 31.69 |
| | පෙබ. 2020 | - | - | - | - | - |
| | මාර්තු 2019 | - | 276.50 | 308.19 | - | 33.83 |
| | අප්‍රේල් 2020 | - | 248.36 | 300.82 | - | 65.25 |

*මූලාශ්‍රය : ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි,ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 2.5 රතු පරිප්පු

### ඉල්ලුම/ සැපයුම හා මිලෙහි හැසිරීම

රතු පරිප්පු තොග මිල කිලෝවකට රු.148.00 -160.00 ක පරාසයක් තුළ විහිදී තිබුණු අතර, එහි සාමාන්‍ය තොග මිල කිලෝවකට රු.152 ක් ලෙස වාර්තා විය. රජය විසින් මිල ඉහළ යෑමේ උපනතිය පාලනය කිරීම සඳහා උපරිම සිල්ලර මිල ලෙස කිලෝ එකකට රු 130.00 මිලක් පනවන ලදී. එසේ වුවත් රට තුල පැවැති කොරෝනා වෛරස තත්ත්වය හේතුවෙන් රටේ සාමාන්‍ය භාණ්ඩ බෙදා හැරීමේ ජාලය බිඳ වැටුණත් අත්‍යවශ්‍ය භාණ්ඩ ජංගම බෙදාහැරීමේ ක්‍රමවේදය මඟින්, සුපිරි වෙළෙඳසැල් මඟින්, රජය යාන්ත්‍රණය වන ලංකා ස.තො.ස, කෝප් සිටි සහ සමුපකාර මඟින් පාරිභෝගිකයන්ට ලැබීමට සලස් වන ලදී. මෙවැනි වටපිටාවක් තුළ වුව ද රතු පරිප්පු තොග මිල මාර්තු මාසයට සාපේක්ෂව 24% ඉහළ ගොස් ඇති අතර පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදයට සාපේක්ෂව 40% න් වැඩි වී ඇත (වගු අංක.2.5.1).

වගුව **2.5.1 :** රතු පරිප්පු තොග මිල සහ සිල්ලර මිල - 2020 මැයි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2020 මැයි** | **2020 මැයි** | **2020 මාර්තු** | **2019 මැයි** | **2020 මාර්තු** | | **2019 මැයි** | |
| | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | % | (කි.ග්‍රෑ.රු.) | % |
| තොග මිල | 148.00-160.00 | 152.43 | 123.35 | 109.13 | *29.08* | *23.58* | *43.31* | *39.69* |
| සිල්ලර මිල | - | - | 143.27 | 129.30 | - | - | - | - |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

මෙම මස තුළ රතු පරිප්පු මෙ.ටො. 14,475ක් ආනයනය කර ඇති අතර එම තොගයේ කිලෝවක සාමාන්‍ය ආනයනික මිල රු.92.32ක් ලෙස සටහන් විය. පසුගිය මාසයේ සාමාන්‍ය ආනයනික මිලට සාපේක්ෂව මෙම මස සාමාන්‍ය ආනයනික මිල 9%කින් පමණ ඉහළ ගොස් ඇත. පසුගිය මාසයේ ආනයනික මුළු පරිප්පු තොගයට සාපේක්ෂව මෙම මස ආනයනික ප්‍රමාණය 29%කින් ඉහළ ගොස් ඇත. මුළු රතු පරිප්පු තොගයම පියළි නොකළ රතු පරිප්පු වූ අතර එම තොගයෙන් 84%ක් ඕස්ට්‍රේලියාවෙන් ද 16%ක් කැනඩාවෙන් ද ආනයනය කොට ඇත. පියළි නොකරන ලද රතු පරිප්පු තොගයේ මුළු වටිනාකම රු.දශ ලක්ෂ 1,336 ක් විය.

**වගුව 2.5.2 : රතු පරිප්පු සඳහා මාසික සාමාන්‍ය ආනයනික, තොග සහ සිල්ලර මිල (2019 දෙසැම්බර් - 2020 මැයි දක්වා)**

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | ආනයනික මිල (මි.ර.ගැ.) කි.ග්‍රෑ.රු. | තොග මිල කි.ග්‍රෑ.රු. | සිල්ලර මිල කි.ග්‍රෑ.රු. | ආන්තිකය (කි.ග්‍රෑ.රු.) | |
|---|---|---|---|---|---|---|
| | | | | | තොග මිල - ආනයනික මිල | සිල්ලර මිල - තොග මිල |
| මැයි 2020 | 18,566 | 99.64 | 152.43 | - | 52.79 | - |
| අප්‍රේල් 2020 | 22,976 | 99.44 | - | - | - | - |
| මාර්තු 2020 | 14,475 | 92.32 | 123.35 | 143.27 | 31.03 | 19.92 |
| පෙබ. 2020 | 11,183 | 84.83 | 126.08 | 143.07 | 41.24 | 17.00 |
| ජන. 2020 | 13,016 | 80.53 | 128.22 | 140.11 | 47.69 | 11.89 |
| දෙසැ. 2019 | 19,642 | 76.23 | 115.28 | 133.37 | 39.04 | 18.10 |

*මූලාශ්‍රය :ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව සහ අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 3.එළවළු
## භෝග තත්ත්වය

දිවයිනේ බොහොමයක් එළවළු නිෂ්පාදන ප්‍රදේශවල 2020 යල කන්නයේ වගා කටයුතු අඛණ්ඩව සිදුවෙමින් පැවතුණි. කොවිඩ් වසංගතය රට තුළ ව්‍යාප්ත වීම වැලැක්වීම සඳහා සෞඛ්‍ය හේතූන් මත ගමනාගමනය ඇතුළු බොහොමයක් කටයුතු රජය විසින් සීමාව කරනු ලැබුව ද කෘෂිකාර්මික කටයුතු එම සීමා කිරීම්වලින් නිදහස් කරනු ලැබීය. එම නිසා යල කන්නයේ වගා ප්‍රගතිය සාමාන්‍ය පරිදි සිදු විය. යල කන්නයේ සමස්ථ එළවළු වගා ඉලක්කය හෙක්.38,634ක් වූ අතර මැයි මාසය අවසන් වන විට 68%ක ප්‍රගතියක් වාර්තා වී තිබුණි. අපේක්ෂිත නිෂ්පාදනය මෙ.ටො. 33,636කි. උඩරට එළවළු සඳහා වගා ඉලක්කය හෙක්.14,273ක් ද ප්‍රගතිය 42%ක් ද විය. උඩරට එළවළු අතරින් බෝංචි සහ මාළුමිරිස් වැඩි වශයෙන් වගා කර තිබූ අතර එම ප්‍රමාණය පිළිවෙළින් හෙක්.1,395ක් සහ හෙක්.1,235ක් විය. පහතරට එළවළු වගා ඉලක්කය හෙක්.24,360ක් ද ප්‍රගතිය 84%ක් ද විය. පහතරට එළවළු වර්ග අතරින් වැඩි වශයෙන් වගා කර තිබුණේ මැකරල් (හෙක්.3,699), වම්බටු (හෙක්.3,549), වට්ටක්කා (හෙක්.3,114) සහ බණ්ඩක්කා (හෙක්.2,723) යන එළවළු වර්ගයන්ය. ***(Crop Forecast yala 2020 Vol.01, Socio Economics & Planning Center/ DOA).***

## ඉල්ලුම / සැපයුම සහ මිල හැසිරීම

රට තුළ කොවිඩ් වසංගතය පැතිරයාම වැලැක්වීම සඳහා ගමනාගමන සහ හුවමාරු කටයුතුවල සීමා කිරීමක් පැවතුණද මහ කන්නයේ අස්වනු නෙලීම් කටයුතු අප්‍රේල් සහ මැයි මාසවලදී ද සිදු වූ බැවින් රටතුළ ප්‍රමාණවත් තරම් එළවළු තොග පැවතුණි. සාමාන්‍ය බෙදාහැරීම් ජාලය අඩපණවීමක් දක්නට ලැබුණු නමුත් එළවළු බෙදාහැරීම සඳහා විකල්ප බෙදාහැරීමේ ක්‍රමවේදයක් ඇති විය. විශේෂයෙන්ම කෘෂිකාර්මික නිෂ්පාදන සහ බෙදා හැරීමේ කටයුතු ඇතුළු අත්‍යවශ්‍ය සේවාවන්ගේ සැපයුම නියාමනය කිරීම සඳහා මාර්තු මාසයේ අගභාගයේදී ජනාධිපති කාර්යසාධක බලකායක් ස්ථාපනය කරන ලදී. එමෙන්ම එළවළු ගොවීන්ගේ එළවළු සෘජුවම මිල දී ගෙන පාරිභෝගිකයන් වෙත බෙදා හැරීම සඳහා වෙළෙඳුන් වෙත ලබා දෙන ලදී. මේ අතර අන්තර්ජාලය මඟින් අලෙවි සහ සෘජුවම නිවෙස්වලට ගොස් අලෙවි කිරීමේ ජාලයන් හරහා ද පාරිභෝගිකයා වෙත එළවළු සැපයීම අඛණ්ඩව සිදු විය. තවද පළාත් පාලන ආයතන සහ සමුපකාර සමිති මඟින් පහසු මිල ගණන් යටතේ අත්‍යවශ්‍ය ආහාර මල්ලක් නිවෙස් වලට බෙදා හැරීම ආරම්භ කරන ලදී. පාරිභෝගිකයන්ගේ නිවසටම එළවළු බෙදාහැරීමේදී පෞද්ගලික වෙළෙඳුන් ඉතා විශාල කාර්යභාරයක් ඉටුකරන ලදී. ශක්තිමත් නියාමනයක් පැවති හෙයින් රටතුළ එළවළු බෙදාහැරීමේ කටයුතු සාර්ථකව ක්‍රියාත්මක වූ අතර පසුගිය මාර්තු මාසයට සාපේක්ෂව මැයි මාසයේදී එළවළු තොග මිල 5%-53% පරාසය තුළ පහළ යන ලදී. එළවළු කිලෝවක උපරිම තොග මිල රු.180.00ක් ලෙස බෝංචි සඳහා ද අවම මිල රු.20.00ක් ලෙස බීට්රූට්, නෝකෝල්, ගෝවා සහ පිපිඤ්ඤා සඳහා ද වාර්තා විය.

පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සැසඳීමේදී බොහොමයක් එළවළු වර්ගවල තොග මිල ගණන් 7%-51% පරාසය තුළ පහළ ගොස් තිබුණි.

## වගුව 3.1 : එළවළු තොග මිල - 2020 මැයි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | (කි.ග්‍රෑ.රු.) | % | (කි.ග්‍රෑ.රු.) | % |
| බෝංචි | 50.00-180.00 | 106.67 | 111.75 | *181.50* | *-5.08* | -4.55 | -74.83 | *-41.23* |
| කැරට් | 50.00-70.00 | 62.67 | 126.50 | *118.25* | *-63.83* | -50.46 | -55.58 | *-47.00* |
| ලීක්ස් | 70.00-120.00 | 94.00 | 106.00 | *56.25* | *-12.00* | -11.32 | 37.75 | *67.11* |
| බීට්රූට් | 20.00-55.00 | 36.61 | 73.41 | *92.21* | *-36.80* | -50.13 | -55.60 | *-60.30* |
| නෝකෝල් | 20.00-60.00 | 40.00 | 51.00 | *82.25* | *-11.00* | -21.57 | -42.25 | *-51.37* |
| රාබු | 30.00-50.00 | 37.33 | 39.00 | *70.13* | *-1.67* | -4.27 | -32.79 | *-46.76* |
| ගෝවා | 20.00-50.00 | 34.00 | 73.25 | *53.11* | *-39.25* | -53.58 | -19.11 | *-35.98* |
| තක්කාලි | 30.00-100.00 | 58.78 | 98.00 | *78.00* | *-39.22* | -40.02 | -19.22 | *-24.64* |
| බණ්ඩක්කා | 50.00-80.00 | 63.00 | 27.75 | *54.38* | *35.25* | 127.03 | 8.63 | *15.86* |
| වම්බටු | 80.00-140.00 | 96.67 | 95.64 | *95.97* | *1.03* | 1.07 | 0.69 | *0.72* |
| මාළු මිරිස් | 80.00-100.00 | 89.33 | 132.50 | *140.75* | *-43.17* | -32.58 | -51.42 | *-36.53* |
| වට්ටක්කා | 25.00-60.00 | 44.56 | 78.50 | *51.25* | *-33.94* | -43.24 | -6.69 | *-13.06* |
| පිපිඤ්ඤා | 20.00-50.00 | 37.33 | 23.14 | *46.38* | *14.20* | 61.36 | -9.04 | *-19.50* |
| කරවිල | 80.00-150.00 | 105.44 | 93.25 | *156.15* | *12.19* | 13.08 | -50.71 | *-32.47* |
| පතෝල | 80.00-120.00 | 101.33 | 71.83 | *125.00* | *29.50* | 41.07 | -23.67 | *-18.93* |
| මුරුංගා | - | - | - | *139.52* | - | - | - | - |
| වැටකොළු | 60.00-140.00 | 95.67 | 68.50 | *103.25* | *27.17* | 39.66 | -7.58 | *-7.34* |
| මෑ කරල් | 40.00-100.00 | 70.74 | 81.50 | *96.14* | *-10.76* | -13.20 | -25.40 | *-26.42* |
| අළු කෙසෙල් | 40.00-70.00 | 53.67 | 72.82 | *51.74* | *-19.15* | -26.30 | 1.93 | *3.73* |
| අමු මිරිස් | 70.00-160.00 | 126.33 | 114.50 | *147.00* | *11.83* | 10.33 | -20.67 | *-14.06* |
| දෙහි | 400.00-600.00 | 520.00 | 53.00 | *335.00* | *467.00* | 881.13 | 185.00 | *55.22* |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## 4. පලතුරු
## ඉල්ලුම / සැපයුම සහ මිලෙහි හැසිරීම

ඉහත සඳහන් කළ පරිදි 2020 අප්‍රේල් සහ මැයි මාසයන්ට අදාළව පලතුරු තොග සහ සිල්ලර මිල එකතු කිරීමේ වැඩසටහන කොවිඩ් -19 වසංගත තත්ත්වය හේතුවෙන් ක්‍රියාත්මක කිරීමට නොහැකි වීමෙන් එම මිල තොරතුරු එම මාසයන්ට අදාළව වාර්තා කිරීමට නොහැකි වී ඇත.

කෙසේ වුවද, මැයි මාසයේ සිට ගොවිපල තොරුතුරු එකතු කිරීම නැවත ඇරඹීමත් සමඟ, මැයි මාසයට අදාළව ගොවි මහතුන්ට ලැබුණු මිල ගණන් වගු අංක 4.1 හි සඳහන්ව ඇත. ඒ අනුව, 2020, මැයි මාසයේදී ඇඹුල් කෙසෙල් සඳහා කිලෝවකට රු.19.62 ක, කෝලිකුට්ටු කෙසෙල් සඳහා කිලෝවකට රු.91.33ක සහ පැපොල් කිලෝවක් සඳහා රු.54.40ක මාසික සාමාන්‍ය මිලක් ගොවිමහතුන්ට ලැබී ඇත. මෙම වසරේ මාර්තු මාසයෙහි මිල ගණන් හා සැසඳීමේදී එය මිල පහළ යාමක් ලෙස පෙන්නුම් කරන අතර ඇඹුල් සඳහා එය 26%ක්, පැපොල් සඳහා 24%ක් සහ කෝලිකුට්ටු සඳහා 7%ක් ලෙස මිල පහළයාමකි. එසේම, 2019 වසරේ මැයි මාසය හා සසඳන කළ, පැපොල් සහ කෝලිකුට්ටු කෙසෙල් සඳහා ගොවි මහතාට ලැබී ඇති මුදල පිළිවෙළින් 27%ක සහ 8%ක මිල ඉහළයාමක් වන අතර, ඇඹුල් කෙසෙල් සඳහා එය 21%ක මිල පහළයාමකි (වගුව 4.1).

### වගුව 4.1 තෝරාගත් පලතුරු වර්ග කිහිපයක් සඳහා ගොවියාට ලැබුණු මිල 2020 - මැයි

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මැයි | 2020 මැයි | 2020 මාර්තු | 2019 මැයි | 2020 මාර්තු | | 2019 මැයි | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | % |
| ඇඹුල් | 18.86 - 21.43 | 19.62 | 26.43 | 24.96 | -6.81 | -25.77 | -5.34 | -21.39 |
| කෝලිකුට්ටු | 71.00 - 116.00 | 91.33 | 98.33 | 84.86 | -7.00 | -7.12 | 6.47 | 7.62 |
| පැපොල් | 48.00 -67.50 | 54.40 | 71.25 | 42.81 | -16.85 | -23.65 | 11.59 | 27.07 |

*මූලාශ්‍රය: අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 4.2 : තෝරාගත් පලතුරු වර්ග කිහිපයක අපනයන ප්‍රමාණය සහ වටිනාකම (2020 මාර්තු - 2020 මැයි)

| පලතුරු වර්ගය | 2020 -මැයි | | | 2020 - අප්‍රේල් | | | 2020 - මාර්තු | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම රු.දශ ලක්ෂ | මිල (නැ.වි.ස.) කි.ග්‍රෑ.රු. | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම රු.දශ ලක්ෂ | මිල (නැ.වි.ස.) කි.ග්‍රෑ.රු. | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම රු.දශ ලක්ෂ | මිල (නැ.වි.ස.) කි.ග්‍රෑ.රු. |
| අන්නාසි | 33.13 | 14.83 | 447.57 | 26.38 | 12.26 | 464.81 | 51.78 | 25.71 | 496.57 |
| පැපොල් | 947.25 | 70.57 | 74.50 | 733.54 | 76.18 | 103.85 | 886.26 | 75.82 | 85.55 |
| අඹ | 31.40 | 20.72 | 660.26 | 13.42 | 4.57 | 340.35 | 11.04 | 7.30 | 661.02 |
| අලිගැටපේර | 4.04 | 2.70 | 667.97 | 7.75 | 4.34 | 560.17 | 5.00 | 2.67 | 533.55 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

### වගුව 4.3 : තෝරාගත් පලතුරු වර්ග කිහිපයක ආනයනික ප්‍රමාණය සහ වටිනාකම (2020 මාර්තු - 2020 මැයි)

| පලතුරු වර්ගය | මැයි-2020 | | | අප්‍රේල් -2020 | | | මාර්තු -2020 | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන වටිනාකම රු.දශ ලක්ෂ | ආනයනික මිල (මි.ර.ගැ) කි.ග්‍රෑ.රු. | ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන වටිනාකම රු.දශ ලක්ෂ | ආනයන මිල (මි.ර.ගැ) කි.ග්‍රෑ.රු | ප්‍රමාණය (මෙ.ටො.) | ආනයන වටිනාකම රු.දශ ලක්ෂ | ආනයන මිල (මි.ර.ගැ) කි.ග්‍රෑ.රු |
| ඇපල් | 831 | 142.37 | 171.36 | 2,763 | 500.28 | 181.07 | 1,643 | 300.25 | 182.71 |
| මිදි | 136 | 58.04 | 428.27 | 321 | 132.97 | 414.49 | 446 | 186.15 | 417.06 |
| දොඩම් | 90 | 12.17 | 134.52 | 293 | 33.25 | 113.35 | 614 | 68.37 | 111.32 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## පලතුරු අපනයනය සහ ආනයනය

ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තු දත්තවලට අනුව ශ්‍රී ලංකාව මැයි මාසයේදී පලතුරු මෙට්‍රික් ටොන් 1,016ක් අපනයනය කොට ඇති අතර එහි වටිනාකම රු.දශ ලක්ෂ 109කි. එම අපනයනික තොගයෙහි 93%ක් පැපොල් වූ අතර, 3%ක් අන්නාසි ද, තවත් 3%ක් අඹ ද විය. ඊට අමතරව, අලිගැටපේර මෙට්‍රික් ටොන් හතරක් ද අපනයනය කොට ඇති අතර එය මුළු අපනයනික තොගයෙන් 1%කට වඩා අඩු ප්‍රමාණයකි (වගුව 4.4).

පලතුරු ආනයනය පිළිබඳව විමසීමේදී, ශ්‍රී ලංකාව අප්‍රේල් මාසයේදී පලතුරු මෙට්‍රික් ටොන් 3,377ක් ද මැයි මාසයේදී මෙට්‍රික් ටොන් 1,057ක් ද ආනයනය කොට ඇති අතර අප්‍රේල් මාසයේදී රු.දශ ලක්ෂ 666ක් ද මැයි මාසයේදී රු.දශලක්ෂ 213ක් ද ඒ සඳහා වැයකොට ඇත. අප්‍රේල් මාසයට අදාළව එම ආනයනික තොගයෙහි 82%ක් ඇපල් ද, 10%ක් මිදි ද, 9%ක් දොඩම් ද විය. මැයි මාසයේදී 79%ක් ඇපල් ද, 13%ක් මිදි ද, 9%ක් දොඩම් ද ලෙස එය වෙනස් වී ඇත. අප්‍රේල් මාසයේදී ඇපල් ප්‍රධාන වශයෙන් ආනයනය කොට ඇත්තේ චීනයෙන් වන අතර මැයි මාසයේදී දකුණු අප්‍රිකාවෙන් සහ චීනයෙනි. මිදි ප්‍රධාන වශයෙන් දකුණු අප්‍රිකාවෙන් සහ ඕස්ට්‍රේලියාවෙන් අප්‍රේල්, මැයි මාසවලදී ආනයනය කොට ඇති අතර දොඩම් ගෙන්වා ඇත්තේ ඊජිප්තුවෙනි. 2020 මාර්තු මාසයේදී පලතුරු ආනයනය මෙට්‍රික් ටොන් 2,703ක් වූ බැවින් අප්‍රේල්

මාසයේදී එය 25%කින් ඉහළ ගොස් ඇති අතර නැවතත් මැයි මාසයේදී 69%කින් අප්‍රේල් මාසයට සාපේක්ෂව පහළ ගොස් ඇත (වගුව 4.5).

## 5. තිරිඟු ඇට, තිරිඟු පිටි සහ සීනි

### තිරිඟු ඇට, තිරිඟු පිටි

මැයි මාසයේදී මෙරටට ගෙන්වන ලද මුළු තිරිඟු ඇට ප්‍රමාණය මෙ.ටො. 194,417 ක් වන අතර එය පසුගිය අප්‍රේල් මාසය (මෙ.ටො. 32,297) හා සැසඳීමේදී කැපී පෙනෙන ඉහළ යාමකි. මෙලෙස ආනයනය කරන ලද තිරිඟු ඇට සඳහා සාමාන්‍ය ආනයනික මිල කිලෝවකට රු.49.52 ක් වූ අතර එය පසුගිය මාසයට (රු.50.17) සාපේක්ෂව කැපී පෙනෙන මිල වෙනස් වීමක් ලෙස සටහන් නොවීය. මැයි මාසය සඳහා තිරිඟු ඇට ප්‍රධාන වශයෙන්ම කැනඩාවෙන් (60%), රුසියාවෙන් (30%) සහ ඇමෙරිකාවෙන් (6%) ආනයනය කර ඇත.

මැයි මාසයේදී මෙරටට ගෙන්වන ලද මුළු තිරිඟු පිටි ප්‍රමාණය මෙ.ටො. 1,075 ක් වන අතර එහි මුළු වටිනාකම රුපියල් දශලක්ෂ 82 කි. පසුගිය මාසය හා සංසන්දනය කරන විට මෙම මස ආනයනය කරන ලද තිරිඟු පිටි ප්‍රමාණය මෙ.ටො. 630 කින් ඉහළ ගොස් තිබුණි. මැයි මාසය සඳහා තිරිඟු පිටි ප්‍රධාන වශයෙන් ඉන්දියාවෙන් ආනයනය කර ඇති අතර, ඒ සඳහා ආනයනික මිල කිලෝවකට රු.75.95 විය.

තිරිඟු පිටි සඳහා දේශීය සිල්ලර මිල ගණන් සලකා බැලීමේදී ,ඒ සඳහා මිල කිලෝවකට රු.90.00-95.00 පරාසයකින් සටහන් වූ අතර සාමාන්‍ය ,සිල්ලර මිල කිලෝවකට රු.92.26ක් විය. පසුගිය මාර්තු මාසය හා සැසඳීමේදී, තිරිඟු පිටි සඳහා සාමාන්‍ය සිල්ලර මිල ගණන් මෙම මාසයේදී ද නොවෙනස්ව පැවතුණි. කෙසේ වෙතත්, පසුගිය වසරේ සමාන කාල පරිච්ඡේදය හා සංසන්දනය කිරීමේදී තිරිඟු පිටි සඳහා දේශීය සිල්ලර මිල ගණන් 1% කින් පහළ ගොස් ඇත.

**වගුව 5.1 : තිරිඟු පිටි හා සීනි සිල්ලර මිල - 2020 මැයි**

| වර්ගය | මිල පරාසය | සාමාන්‍ය මිල | | | මිල වෙනස්වීම | | | |
|---|---|---|---|---|---|---|---|---|
| | **2020 මැයි** | **2020 මැයි** | **2020 මාර්තු** | **2019 මැයි** | **2020 මාර්තු** | | **2019 මැයි** | |
| | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. | % | කි.ග්‍රෑ.රු. | කි.ග්‍රෑ.රු. |
| තිරිඟු පිටි | 90.00 - 95.00 | 92.26 | 92.24 | 93.64 | *0.02* | *0.02* | *-1.38* | *-1.47* |
| සීනි | 120.59 -130.29 | 125.23 | 109.52 | 99.42 | *15.71* | *14.34* | *25.81* | *25.96* |

*මූලාශ්‍රය: ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව*

**වගුව 5.2: ආනයනික තිරිඟු පිටි සහ තිරිඟු (ධාන්‍ය) ප්‍රමාණය, වටිනාකම සහ මිල (2019 දෙසැම්බර් - 2020 මැයි)**

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගා) (කි.ග්‍රෑ.රු) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| **තිරිඟු පිටි** | | | | | |
| මැයි 2020 | 1,075 | 81.66 | 75.96 | 92.26 | *16.30* |
| අප්‍රේල් 2020 | 444 | 33.38 | 75.05 | 89.04 | *13.99* |
| මාර්තු 2020 | 917 | 66.17 | 72.18 | 92.24 | *20.06* |
| පෙබරවාරි 2020 | 4,560 | 296.41 | 65.00 | 92.55 | *27.55* |
| ජනවාරි 2020 | 2,735 | 184.43 | 67.44 | 92.17 | *24.73* |
| දෙසැම්බර් 2020 | 929 | 71.66 | 77.12 | 93.20 | *16.08* |
| **තිරිඟු (ධාන්‍ය)** | | | | | |
| මැයි 2020 | 194,417 | 9,627 | 49.52 | 92.26 | *42.74* |
| අප්‍රේල් 2020 | 32,297 | 1620 | 50.17 | 89.04 | *38.87* |
| මාර්තු 2020 | 309,091 | 14,829 | 71.56 | 92.24 | *20.68* |
| පෙබ. 2020 | 90,250 | 4,267 | 47.28 | 92.55 | *45.27* |
| ජන. 2020 | 89,391 | 4,139 | 46.31 | 92.17 | *45.86* |
| දෙසැ. 2019 | 137,220 | 6,423 | 46.81 | 93.20 | *46.39* |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතනය*

## සීනි

සමස්ථයක් ලෙස මැයි මාසයේදී මෙරටට ගෙන්වන ලද මුළු සීනි ප්‍රමාණය මෙ.ටො. 30,478 ක් වන අතර එහි මුළු වටිනාකම රුපියල් දශ ලක්ෂ 2,301 කි. පසුගිය මාර්තු මාසය හා සංසන්දනය කරන විට මෙම මස ආනයනය කරන ලද සීනි ප්‍රමාණය මෙ.ටො. 35,529 කින් පහළ ගොස් තිබුණි. මැයි මාසය සඳහා සීනි තොග ප්‍රධාන වශයෙන්ම ඉන්දියාවෙන් (95%) ආනයනය කර ඇති අතර, ඒ සඳහා ආනයනික මිල කිලෝවකට රු.74.85ක් විය. මැයි මාසයේ දී සීනි සඳහා සාමාන්‍ය ආනයනික මිල කිලෝවකට රු.75.51 විය. පසුගිය මාර්තු මාසය හා සැසදීමේදී, සීනි සඳහා සාමාන්‍ය ආනයනික මිල ආසන්න වශයෙන් කිලෝවකට රු.4.00 කින් ඉහළ ගොස් තිබුණි.

දේශීය වෙළඳපොළ තුළ සීනි සිල්ලර මිල ගණන් සලකා බැලීමේදී මැයි මාසයේදී සීනි සඳහා මිල කිලෝවකට රු.121.00-130.00 පරාසයකින් සටහන් වූ අතර ඒ සඳහා සාමාන්‍ය සිල්ලර මිල කිලෝවකට රු.125.00ක් විය. පසුගිය මාර්තු මාසය හා සැසඳීමේදී සීනි සඳහා සාමාන්‍ය සිල්ලර මිල ගණන් මෙම මාසයේදී කිලෝවකට රු.16.00කින් පමණ ඉහළ ගොස් තිබුණි. තවද, පසුගිය වසරේ සමාන කාලපරිච්ඡේදය හා සංසන්දනය කිරීමේදී සීනි සඳහා දේශීය සිල්ලර මිල ගණන් ද මෙම මාසයේදී ආසන්න වශයෙන් 26%කින් පමණ ඉහළ ගොස් තිබුණි.

### වගුව 5.3 : ආනයනික සීනි ප්‍රමාණය, වටිනාකම සහ මිල (2019 දෙසැම්බර් - 2020 මැයි)

| මාසය | ප්‍රමාණය (මෙ.ටො.) | වටිනාකම (රු.දශ ලක්ෂ) | ආනයනික මිල (මි.ර.ගැ) (කි.ග්‍රෑ.රු) | සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.) | දළ ආන්තිකය (කි.ග්‍රෑ.රු.) |
|---|---|---|---|---|---|
| මැයි 2020 | 30,478 | 2,301.30 | 75.51 | 125.23 | *49.72* |
| අප්‍රේල් 2020 | 34,839 | 2,547.70 | 73.13 | 119.21 | *46.08* |
| මාර්තු 2020 | 66,007 | 4,723.60 | 71.56 | 109.52 | *37.96* |
| පෙබ. 2020 | 56,492 | 3,824.00 | 67.69 | 108.30 | *40.61* |
| ජන. 2020 | 45,565 | 2,933.30 | 64.38 | 107.20 | *42.82* |
| දෙසැ. 2019 | 29,602 | 1,890.40 | 63.86 | 106.50 | *42.64* |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව, අලෙවි, ආහාර ප්‍රතිපත්ති හා කෘෂි ව්‍යාපාර අංශය, හෙ.කො.ගො.ප.පු.ආයතන*

### වගුව 6: ආහාර ද්‍රව්‍ය ආනයනය - 2020 මැයි

| වර්ගය | ප්‍රමාණය (මෙ.ටො.) | | | වටිනාකම (රු.දශ ලක්ෂ) | | | ආනයනිකමිල (මි.ර.ගැ) (කි.ග්‍රෑ.රු.) | | |
|---|---|---|---|---|---|---|---|---|---|
| | 2020 මාර්තු | 2020 පෙබ. | වෙනස % | 2020 මාර්තු | 2020 පෙබ. | වෙනස % | 2020 මාර්තු | 2020 පෙබ. | වෙනස % |
| සහල් | 376 | 891 | -57.8 | 45.8 | 101.9 | -55.0 | 121.96 | 114.40 | 6.6 |
| රතු ලූනු | 1,275 | 104 | 1129.0 | 214.4 | 18.5 | 1058.8 | 168.21 | 178.41 | -5.7 |
| ලොකු ලූනු | 17,954 | 30,453 | -41.0 | 765.0 | 2195.4 | -65.2 | 42.61 | 72.09 | -40.9 |
| අර්තාපල් | 3,948 | 13,269 | -70.2 | 230.4 | 837.3 | -72.5 | 58.36 | 63.11 | -7.5 |
| වියළි මිරිස් | 3,389 | 6,180 | -45.2 | 1234.1 | 2327.8 | -47.0 | 364.18 | 376.69 | -3.3 |
| රතු පරිප්පු | 18,566 | 22,976 | -19.2 | 1850.0 | 2284.8 | -19.0 | 99.64 | 99.44 | 0.2 |
| මුං ඇට | 990 | 926 | 6.9 | 190.7 | 187.3 | 1.8 | 192.65 | 202.34 | -4.8 |
| කව්පි | 344 | 884 | -61.1 | 56.4 | 150.9 | -62.6 | 163.93 | 170.72 | -4.0 |
| සුදු ලූණු | 3,911 | 3,896 | 0.4 | 852.8 | 957.4 | -10.9 | 218.07 | 245.74 | -11.3 |
| තිරිඟුපිටි | 1,075 | 445 | 141.7 | 81.6 | 33.4 | 144.7 | 75.95 | 75.04 | 1.2 |
| තිරිඟු (ධාන්‍ය) | 194,417 | 109,679 | 77.3 | 9627.2 | 5462.6 | 76.2 | 49.52 | 49.81 | -0.6 |
| සීනි (සුදු) | 30,477 | 34,964 | -12.8 | 2301.3 | 2557.9 | -10.0 | 75.51 | 73.16 | 3.2 |
| බඩඉරිඟු (වෙනත්) | 26 | 204 | -87.3 | 3.0 | 23.5 | -87.4 | 114.09 | 115.20 | -1.0 |

*මූලාශ්‍රය: ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව*

## වගුව 7 : මාසික වර්ෂාපතනය (මි.මී.) – 2020 මැයි

| වර්ෂාපතන ස්ථානය | මුළු වර්ෂාපතනය (මි.මී.) | තිස් වසරක සාමාන්‍ය වර්ෂාපතනය (මි.මී.) | මුළු වැසි දින ගණන | තිස් වසරක සාමාන්‍ය වැසි දින ගණන |
|---|---|---|---|---|
| අනුරාධපුර | - | 68.7 | - | 5 |
| බදුල්ල | - | 119.4 | - | 9 |
| බණ්ඩාරවෙල | - | 112.2 | - | 9 |
| මඩකලපුව | - | 89.0 | - | 6 |
| කොළඹ | 200.2 | 128.0 | 18 | 9 |
| ගාල්ල | 314.4 | 111.3 | 20 | 9 |
| හම්බන්තොට | - | 65.4 | - | 5 |
| යාපනය | 39.9 | 25.7 | 07 | 2 |
| කටුගස්තොට | - | 71.9 | - | 8 |
| කටුනායක | - | 132.9 | - | 8 |
| කුරුණෑගල | 316.9 | 139.1 | 18 | 8 |
| මහඉලුප්පල්ලම | - | 84.9 | - | 6 |
| මන්නාරම | - | 44.4 | - | 3 |
| නුවරඑළිය | - | 71.5 | - | 8 |
| පොතුවිල් | - | - | - | - |
| පුත්තලම | - | 67.7 | - | 5 |
| රත්මලාන | - | 141.5 | - | 9 |
| රත්නපුර | - | 212.2 | - | 14 |
| ත්‍රිකුණාමලය | - | 55.5 | - | 4 |
| වව්නියාව | - | 62.9 | - | 4 |
| පොලොන්නරුව | - | - | - | - |
| මොණරාගල | - | - | - | - |
| මත්තල | - | - | - | - |

*මූලාශ්‍රය : කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව*

## ඇමුණුම 01: කොළඹ සහ අවට වෙළෙඳපොළවල සහල් සිල්ලර මිල (කි.ග්‍රෑ.රු.)

| මාසය | සම්බා 1 | | | නාඩු 1 | | | රතු කැකුළු | | | සුදු කැකුළු | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 |
| ජන | 116.65 | 115.44 | 98.00 | 107.10 | 93.00 | 98.00 | 90.96 | 83.12 | 110.60 | 95.24 | 90.02 | 108.50 |
| පෙබ | 115.03 | 116.14 | 98.00 | 103.88 | 94.64 | 98.00 | 87.49 | 82.07 | 104.20 | 90.00 | 87.74 | 104.75 |
| මාර්තු | 115.34 | 109.87 | 98.00 | 101.20 | 94.63 | 98.00 | 86.63 | 78.87 | 97.55 | 87.25 | 83.14 | 97.98 |
| අප්‍රේල් | 116.93 | 102.58 | | 102.24 | 92.17 | | 85.43 | 79.92 | | 86.74 | 84.39 | |
| මැයි | 117.36 | 99.05 | | 106.56 | 92.83 | | 85.08 | 80.74 | | 86.25 | 87.00 | |
| ජූනි | 119.56 | 99.33 | | 103.22 | 92.73 | | 83.32 | 79.19 | | 86.52 | 85.64 | |
| ජූලි | 119.08 | 98.81 | | 99.99 | 92.75 | | 80.52 | 79.31 | | 83.80 | 85.86 | |
| අගෝ. | 118.72 | 98.35 | | 96.68 | 92.49 | | 80.42 | 81.14 | | 84.25 | 88.49 | |
| සැප්. | 118.15 | 99.58 | | 95.11 | 95.00 | | 79.26 | 84.14 | | 82.76 | 90.23 | |
| ඔක්. | 119.98 | 102.86 | | 94.97 | 99.95 | | 80.08 | 90.11 | | 84.54 | 94.88 | |
| නොවැ. | 115.02 | 105.46 | | 92.27 | 102.03 | | 82.65 | 96.96 | | 87.55 | 98.70 | |
| දෙසැ. | 115.70 | 105.46 | | 93.13 | 105.60 | | 83.48 | 107.46 | | 89.95 | 107.48 | |












ඇමුණුම : 02 පිටකොටුව සහ අවට වෙළෙඳපොළවල වියළි මිරිස් සහ රතුළූණු , ලොකුළූණු , අර්තාපල් සිල්ලර මිල (කි.ග්‍රෑ.රු)

| මාසය | වියළි මිරිස් | | | රතුළූණු | | | ලොකුළූණු | | | අර්තාපල් -නුවරඑළිය | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 | 2018 | 2019 | 2020 |
| ජන | 263.76 | 330.31 | 568.88 | 515.82 | | | 143.32 | 85.22 | 158.34 | 163.50 | 215.71 | 230.30 |
| පෙබ | 271.41 | 335.00 | 616.91 | | 176.36 | 589.00 | 118.86 | 81.33 | 187.64 | 149.12 | 168.89 | 221.45 |
| මාර්තු | 284.90 | 329.23 | 592.69 | 204.17 | 168.97 | | 88.58 | 78.17 | 182.10 | 139.65 | 164.00 | 196.08 |
| අප්‍රේල් | 298.03 | 324.25 | | | 175.37 | | 67.31 | 91.75 | | 149.37 | 191.47 | |
| මැයි | 306.67 | 328.50 | | | 201.43 | | 99.21 | 93.54 | | 165.33 | 200.97 | |
| ජූනි | 313.87 | 345.06 | | 192.53 | 229.57 | | 108.62 | 114.91 | | 191.52 | 207.45 | |
| ජූලි | 325.59 | 365.35 | | 170.61 | 222.51 | | 115.02 | 124.20 | | 206.17 | 235.89 | |
| අගෝ. | 323.56 | 371.46 | | 179.06 | 175.95 | | 115.74 | 132.13 | | 207.29 | 234.10 | |
| සැප්. | 311.60 | 434.22 | | 164.11 | 191.81 | | 109.70 | 167.17 | | 167.27 | 209.86 | |
| ඔක්. | 315.11 | 484.80 | | 168.06 | 325.31 | | 111.28 | 248.02 | | 155.45 | 202.38 | |
| නොවැ. | 322.74 | 502.09 | | 169.23 | 478.63 | | 120.24 | 192.69 | | 192.07 | 213.71 | |
| දෙසැ. | 324.98 | 518.89 | | | 608.84 | | 102.86 | 178.67 | | 214.56 | 232.91 | |












ඇමුණුම : **03** තෝරාගත් නිෂ්පාදන ප්‍රදේශවල ගොවිපල නිෂ්පාදන මිල ගණන් (කි.ග්‍රෑ.රු.)

මැයි - **2020**

| වර්ගය | 1 | 2 | 3 | 4 | වර්ගය | 1 | 2 | 3 | 4 | වර්ගය | 1 | 2 | 3 | 4 |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | සතිය | සතිය | සතිය | සතිය | | සතිය | සතිය | සතිය | සතිය | | සතිය | සතිය | සතිය | සතිය |
| වී | | | | | අර්තාපල් | | | | | ලීක්ස් | | | | |
| කෙටි වී (සුදු) | | | | | නුවරඑළිය | | 138.00 | 127.00 | 128.00 | වැලිමඩ | | | | |
| අනුරාධපුර | | | | | බදුල්ල | | 123.00 | 128.00 | 145.00 | නුවරඑළිය | | 88.00 | 72.00 | 78.00 |
| පොලොන්නරුව | | 53.90 | 54.84 | 54.68 | වැලිමඩ | | | | | | | | | |
| කලාවැව | | 53.00 | 54.00 | 53.00 | ධාන්‍ය | | | | | බීට්රූට් | | | | |
| කුරුණෑගල | | 46.83 | 50.80 | 53.40 | මුං ඇට | | | | | හඟුරන්කෙත | | 45.00 | 40.00 | |
| දෙහිඅත්තකණ්ඩිය | | 50.33 | 52.42 | 51.33 | ගල්ගමුව | | | | | නුවරඑළිය | | 28.00 | 32.00 | 37.00 |
| අම්පාර | | | | | කලාවැව | | | | | දඹුල්ල | | 35.40 | 36.00 | 42.40 |
| දිග වී (සුදු) | | | | | ඇඹිලිපිටිය | | | | | කුරුණෑගල | | | | |
| අනුරාධපුර | | | | | කුරුණෑගල | | | | | වැලිමඩ | | | | |
| පොලොන්නරුව | | 53.90 | 54.84 | 53.25 | අනුරාධපුර | | | | | නොකෝල් | | | | |
| කලාවැව | | 51.00 | 52.25 | 51.40 | කව්පි | | | | | හඟුරන්කෙත | | 22.50 | 22.50 | 42.50 |
| කුරුණෑගල | | 46.83 | 50.90 | 53.50 | අනුරාධපුර | | | | | නුවරඑළිය | | 27.00 | 27.00 | 38.00 |
| දෙහිඅත්තකණ්ඩිය | | 50.00 | 52.42 | 51.33 | ගල්ගමුව | | | | | වැලිමඩ | | | | |
| ඇඹිලිපිටිය | | | | | නිකවැරටිය | | | | | රාබු | | | | |
| අම්පාර | | | | | කලාවැව | | | | | හඟුරන්කෙත | | 22.50 | 20.00 | |
| මාතර | | 51.20 | 51.20 | 50.60 | ඇඹිලිපිටිය | | | | | නුවරඑළිය | | 23.00 | 23.00 | 38.00 |
| හම්බන්තොට | | | | | කුරුණෑගල | | | | | වැලිමඩ | | | | |
| දිග වී (රතු) | | | | | බඩඉරිඟු | | | | | ගෝවා | | | | |
| මාතර | | 51.20 | 51.20 | 50.60 | අනුරාධපුර | | | | | හඟුරන්කෙත | | 25.00 | 20.00 | 37.50 |
| හම්බන්තොට | | 49.50 | 51.75 | 51.75 | කලාවැව | | | | | නුවරඑළිය | | 37.00 | 33.00 | 43.00 |
| අම්පාර | | | | | තල | | | | | වැලිමඩ | | | | |
| ඇඹිලිපිටිය | | 51.50 | 52.40 | 52.40 | අනුරාධපුර | | | | | හම්බන්තොට | | | | |
| අතිරේක ආහාර | | | | | කලාවැව | | | | | බදුල්ල | | 28.00 | 29.00 | 45.00 |
| වියළි මිරිස් | | | | | උඳු | | | | | තක්කාලි | | | | |
| අනුරාධපුර | | | | | කලාවැව | | | | | හඟුරන්කෙත | | 35.00 | 27.50 | 35.00 |
| ගල්ගමුව | | | | | එළවළු (උඩ | | | | | නුවරඑළිය | | | | |
| කලාවැව | | | | | බෝංචි | | | | | හම්බන්තොට | | 32.00 | 32.00 | 47.00 |
| රතුළූණු | | | | | දඹුල්ල | | 70.00 | 78.60 | 168.00 | දඹුල්ල | | 40.60 | 38.40 | 63.20 |
| පුත්තලම | | | | | හඟුරන්කෙ | | | | | එළවළු (පහතරට) | | | | |
| | | | | | වැලිමඩ | | | | | බණ්ඩක්කා | | | | |
| ලොකුළූණු | | | | | බදුල්ල | | 48.00 | 79.00 | 150.00 | අනුරාධපුර | | | | |
| දඹුල්ල | | | | | කැරට් | | | | | දඹුල්ල | | 49.60 | 46.00 | 49.60 |
| කලාවැව | | | | | හඟුරන්කෙ | | 66.67 | 62.50 | 75.00 | හම්බන්තොට | | | | |
| අනුරාධපුර | | | | | නුවරඑළිය | | 63.00 | 53.00 | 63.00 | ඇඹිලිපිටිය | | 46.00 | 56.00 | 74.00 |
| කුරුණෑගල | | | | | වැලිමඩ | | | | | මාතර | | 55.00 | 90.00 | 90.00 |

ඇමුණුම **3** (ඉතිරිය)

| වර්ගය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය | වර්ගය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය | වර්ගය | 1 සතිය | 2 සතිය | 3 සතිය | 4 සතිය |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| වම්බටු | | | | | වට්ටක්කා | | | | | දෙහි | | | | |
| අනුරාධපුර | | | | | දඹුල්ල | | 28.80 | 21.20 | 32.40 | හම්බන්තොට | | 275.00 | 275.00 | 275.00 |
| දඹුල්ල | | 46.60 | 49.60 | 89.80 | හම්බන්තො | | 36.00 | 36.00 | 34.00 | ඇඹිලිපිටිය | | 415.00 | 400.00 | 412.50 |
| හම්බන්තොට | | 40.00 | 40.00 | | ඇඹිලිපිටිය | | 40.00 | 42.00 | 44.00 | මොණරාගල | | | | |
| ඇඹිලිපිටිය | | 56.00 | 77.00 | 84.00 | මාතර | | 65.00 | 70.00 | 60.00 | පළතුරු | | | | |
| මාතර | | 75.00 | 87.50 | 120.00 | අනුරාධපුර | | | | | කෙසෙල් | | | | |
| වැලිමඩ | | | | | මොණරාගල | | | | | ඇඹුල් | | | | |
| | | | | | පිපිඤ්ඤා | | | | | මොණරාගල | | | | |
| මාළු මිරිස් | | | | | අනුරාධපුර | | | | | ඇඹිලිපිටිය | | 18.86 | 18.57 | 21.43 |
| වැලිමඩ | | | | | දඹුල්ල | | 18.20 | 17.80 | 33.00 | හම්බන්තොට | | | | |
| කරවිල | | | | | හම්බන්තො | | 35.00 | 35.00 | 23.75 | කෝලිකුට්ටු | | | | |
| අනුරාධපුර | | | | | මාතර | | 35.00 | 40.00 | 55.00 | මොණරාගල | | | | |
| දඹුල්ල | | 56.20 | 62.60 | 95.00 | මෑ කරල් | | | | | ඇඹිලිපිටිය | | 71.00 | 71.00 | 116.00 |
| හම්බන්තොට | | 48.00 | 48.00 | 72.00 | දඹුල්ල | | 47.20 | 42.40 | 60.40 | හම්බන්තොට | | 97.50 | 97.50 | 95.00 |
| ඇඹිලිපිටිය | | 96.00 | 123.00 | 119.00 | හම්බන්තො | | 26.25 | 26.25 | 33.75 | ගස් ලබු (කි.ගෑ.රු.) | | | | |
| මාතර | | | | | ඇඹිලිපිටිය | | 66.00 | 70.00 | 72.50 | මොණරාගල | | | | |
| පතෝල | | | | | මාතර | | | 82.50 | 102.50 | ඇඹිලිපිටිය | | 48.00 | 48.00 | 50.40 |
| දඹුල්ල | | 47.80 | 46.40 | 90.20 | අනුරාධපුර | | | | | හම්බන්තොට | | 67.50 | 67.50 | 45.00 |
| හම්බන්තොට | | 46.25 | 46.25 | 50.00 | අළු කෙසෙල් | | | | | අන්නාසි (කි.ගෑ.රු.) | | | | |
| අඇඹිලිපිටය | | 59.00 | 59.00 | 100.00 | හම්බන්තො | | 33.75 | 33.75 | 31.67 | දිවුලපිටිය | | | | |
| මාතර | | 95.00 | 105.00 | 120.00 | ඇඹිලිපිටිය | | 34.00 | 34.00 | 40.00 | | | | | |
| අනුරාධපුරය | | | | | මාතර | | 80.50 | | | | | | | |
| වැටකොළු | | | | | අමු මිරිස් | | | | | | | | | |
| දඹුල්ල | | 72.20 | 71.20 | 91.20 | දඹුල්ල | | 75.60 | 69.20 | 67.20 | | | | | |
| හම්බන්තොට | | 30.00 | 30.00 | 48.00 | හම්බන්තො | | | | | | | | | |
| ඇඹිලිපිටිය | | 93.75 | 96.25 | 110.00 | ඇඹිලිපිටිය | | 182.00 | 186.00 | 195.00 | | | | | |
| මාතර | | 82.50 | 82.50 | 117.50 | පුත්තලම | | | 90.00 | 125.00 | | | | | |
| අනුරාධපුර | | | | | අනුරාධපුර | | | | | | | | | |